# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව

# 1987 අංක 3 දරන පොදු කොන්ත්‍රාත් ගිවිසුම් පනත


[සහතිකය සටහන් කළේ 1987 ජනවාරි මස 30 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

1987 ජනවාරි මස 30 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිල දී ලබාගත හැකිය

මිල : රු. 2.10 යි                    තැපැල් ගාස්තුව : රු. 1.15 යි

## 1987 අංක 3 දරන පොදු කොන්ත්‍රාත් ගිවිසුම් පනත

[සහතිකය සටහන් කළේ 1987 ජනවාරි මස 30 වන දින.]

**එල්. ඩී.—ඕ. 13/80**

**පොදු කොන්ත්‍රාත් ගිවිසුම් සහ කිසියම් පොදු මණ්ඩලයක් වෙත පොදු කොන්ත්‍රාත් ගිවිසුම්වලට ටෙන්ඩර් කරන නැතහොත් පොදු මණ්ඩලයක් සමග පොදු කොන්ත්‍රාත් ගිවිසුම්වලට ඇතුළත් වන තැනැත්තන් ලියාපදිංචි කිරීම සඳහාත්, පරීක්ෂණ මූල මණ්ඩලයක් පත් කිරීම සඳහා සහ පොදු කොන්ත්‍රාත් ගිවිසුම්වලට සම්බන්ධ කාරණා විමර්ශනය කිරීම පිණිස සංස්ථාපනය කරනු ලබන විනිශ්චයාධිකාරයකට සාමාජිකයන් නම් කරනු ලැබීම සඳහාත් විධිවිධාන සැලැස්වීම පිණිස ද ඊට සම්බන්ධ හෝ ආනුෂංගික කාරණා සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස ද වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

**ලුහුඬු නාමය හා ක්‍රියාත්මක වීමේ දිනය.**

1. මේ පනත 1987 අංක 3 දරන පොදු කොන්ත්‍රාත් ගිවිසුම් පනත යනුවෙන් හඳුන්වනු ලබන අතර, ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන නියමයකින් අමාත්‍යවරයා විසින් නියම කරනු ලබන දිනයක එය ක්‍රියාත්මක විය යුතු ය.

**පොදු කොන්ත්‍රාත් ගිවිසුම්වලට පනත අදාළවීම.**

2. (1) කොන්ත්‍රාත් ගිවිසුම් පිරිවැය රුපියල් පණස් ලක්ෂයක් ඉක්මවන්නා වූ අවස්ථාවක සෑම පොදු කොන්ත්‍රාත් ගිවිසුමකට ම, මේ පනතෙහි විධිවිධාන, (2) වන උපවගන්තියේ විධිවිධානවලට යටත්ව, අදාළ විය යුතු ය.

මේ උපවගන්තියෙහි “ කොන්ත්‍රාත් ගිවිසුම් පිරිවැය ” යන්නෙන්, ඒ කොන්ත්‍රාත් ගිවිසුමෙහි අපේක්ෂිත නැතහොත් ඇස්තමේන්තු කරන ලද ප්‍රතිෂ්ඨාව ද, ටෙන්ඩරය පිළිගැනීමෙන් ඒ කොන්ත්‍රාත් ගිවිසුම තීරණය කරනු ලැබ ඇති අවස්ථාවක, ඒ කොන්ත්‍රාත් ගිවිසුම සඳහා වූ ගිවිසගත් ප්‍රතිෂ්ඨාව ද අදහස් වන අතර, ඒ අනුව, කොන්ත්‍රාත් ගිවිසුම කොටස් වශයෙන් ඉටු කිරීම සඳහා වූ කොන්ත්‍රාත් ගිවිසුමක් වන අවස්ථාවක, ඒ ප්‍රතිෂ්ඨාව ඒ කොටස් වෙනුවෙන් ගෙවිය යුතු මුදල්වල එකතුව විය යුතු ය.

(2) මේ පනතෙහි විධිවිධාන—

(අ) ජාතික ආර්ථිකයෙහි යහපත පිණිස, සාමාන්‍ය හෝ විශේෂ නියමයක් මගින් ජනාධිපතිවරයා විසින් නිදහස් කරනු ලැබිය හැකි යම් පොදු කොන්ත්‍රාත් ගිවිසුමකට හෝ යම් පොදු කොන්ත්‍රාත් ගිවිසුම් පන්තියකට ;

(ආ) කිසියම් පොදු මණ්ඩලයක් විසින් ප්‍රසිද්ධ වෙන්දේසියක් මගින් කරනු ලබන විකිණීමකට

අදාළ නොවිය යුතු ය.

### I වන කොටස

### පරීක්ෂණ මූල මණ්ඩලය පත් කිරීම සහ විනිශ්චයාධිකාරයේ සාමාජිකයන් නම් කිරීම.

**මූල මණ්ඩලය පත් කිරීම සහ විනිශ්චයාධිකාරය නම් කිරීම.**

3. (1) කාර්මික, වාණිජ, නෛතික හෝ මුදල් සහ පරිපාලන කටයුතු සම්බන්ධයෙන් පළපුරුද්දක් ඇතැයි ද පරිණත භාවයක් පෙන්වා ඇතැයි ද ජනාධිපතිවරයාට පෙනී යන තැනැත්තන් අතුරින්, තැනැත්තන් දහ දෙනෙකුට නොඅඩු පරීක්ෂණ මූල මණ්ඩලයක් ජනාධිපතිවරයා විසින් කලින් කල පත් කරනු ලැබිය හැකි ය.

(2) මෙහි පළමුවන උපලේඛනයෙහි සඳහන් විධිවිධාන, මූල මණ්ඩලයෙහි සාමාජිකයන් සම්බන්ධයෙන් අදාළ විය යුතු ය.

(3) මේ පනත යටතේ වූ යම් විමර්ශනයක් පවත්වාගෙන යාමේ කාර්යය සඳහා, (මෙහි මින් මතු "විනිශ්චයාධිකාරය" යනුවෙන් සඳහන් කරනු ලබන) පරීක්ෂණ විනිශ්චයාධිකාරයක් සංස්ථාපනය කිරීම පිණිස ජනාධිපතිවරයා විසින්, මූල මණ්ඩලයේ සාමාජිකයන් ගෙන් එක් කෙනෙකු හෝ වැඩි ගණනක් නම් කරනු ලැබිය හැකි ය.

(4) මූල මණ්ඩලයේ සාමාජිකයන් එක් කෙනෙකුට වැඩි ගණනක් විනිශ්චයාධිකාරයට නම් කරනු ලැබ ඇති අවස්ථාවක, ඔවුන් ගෙන් එක් තැනැත්තකු විනිශ්චයාධිකාරයේ සභාපතිවරයා ලෙස ජනාධිපතිවරයා විසින් නම් කරනු ලැබිය හැකි ය.

(5) මේ වගන්තිය යටතේ විනිශ්චයාධිකාරයක් සංස්ථාපනය කරනු ලබන අවස්ථාවක, 5 වන වගන්තිය යටතේ පත් කරනු ලැබූ පොදු කොන්ත්‍රාත් ගිවිසුම් රෙජිස්ට්‍රාර්වරයා, එම විනිශ්චයාධිකාරයේ ලේකම්වරයා ලෙස ක්‍රියා කළ යුතු ය.

විනිශ්චයාධිකාරයේ බලතල හා කාර්ය.

4. (1) මේ පනත මගින් විනිශ්චයාධිකාරය වෙත පවරන ලද හෝ නියම කරන ලද බලතල හා කාර්ය ද විශේෂයෙන් ම පහත දැක්වෙන බලතල හා කාර්ය ද විනිශ්චයාධිකාරයට තිබිය යුතු අතර, ඒ බලතල හා කාර්ය ක්‍රියාත්මක කිරීම සහ ඉටු කිරීම විනිශ්චයාධිකාරය විසින් කරනු ලැබිය හැකි ය :—

(අ) ජනාධිපතිවරයා විසින් දෙනු ලැබිය හැකි යම් විධානවලට යටත්ව, යම් පොදු කොන්ත්‍රාත් ගිවිසුමකට අදාළ යම් කාරණයක් පිළිබඳව විමර්ශනය කර ජනාධිපතිවරයා වෙත වාර්තා කිරීම ;

(ආ) යම් තැනැත්තකු විනිශ්චයාධිකාරය ඉදිරියට කැඳවීම සහ (අ) ඡේදය යටතේ කර ගෙන යනු ලබන යම් විමර්ශනයකට අදාළව තමා දන්නා තොරතුරු කිසිවක් හෙළිදරව් කරන ලෙස හෝ තම සන්තකයෙහි නැතහොත් තම පාලනය යටතේ ඇති යම් පොතක් හෝ ලේඛනයක් ඉදිරිපත් කරන ලෙස හෝ යම් තැනැත්තකුට විධාන කිරීම ;

(ඇ) තම සන්තකයෙහි නැතහොත් තම පාලනය යටතේ තිබෙන්නා වූ නැතහොත් තිබිය හැකි වූ ද, ලියවිල්ලකින් වූ දැන්වීමක සඳහන් වූ ද, යම් ලේඛනයක් හෝ යම් ලේඛනයක සහතික කරන ලද පිටපතක් ඉදිරිපත් කරන ලෙස හෝ සපයන ලෙස යම් පොදු මණ්ඩලයක හෝ යම් පොදු නැතහොත් පෞද්ගලික සමාගමක ප්‍රධාන විධායක නිලධරයාට හෝ එය භාරව සිටින තැනැත්තාට හෝ ඒ දැන්වීම මගින් නියම කිරීම ;

(ඈ) මේ පනතේ සියලු විධිවිධාන හෝ විධිවිධාන අතුරින් යම් විධි විධානයක් හෝ අනුව ක්‍රියා කරන ලෙස නියම කරමින් යම් තැනැත්තකු වෙත ලියවිල්ලකින් සාමාන්‍ය හෝ විශේෂ විධාන කිරීම ; සහ

(ඉ) මේ පනත යටතේ යම් විමර්ශනයක් කර ගෙන යාම පහසු කිරීම සඳහා අවශ්‍ය වෙනත් සියලු දේ කිරීම.

(2) වෙනත් යම් නීතියක කුමක් සඳහන්ව ඇත ද, මේ වගන්තිය යටතේ ඉල්ලීමක්, නියමයක් හෝ විධානයක් කරන ලද්දේ නැතහොත් දෙන ලද්දේ යම් තැනැත්තකු වෙත ද, නොපමාව හෝ එහි සඳහන් කාලය ඇතුළත හෝ ඒ අනුව ක්‍රියා කිරීම, ඒ තැනැත්තාගේ කාර්ය විය යුතු අතර, සාධාරණ හේතුවක් නොමැතිව ඔහු එසේ කිරීම පැහැර හැරියහොත් විනිශ්චයාධිකාරයේ අධිකාරයට අපහාස කිරීමේ නැතහොත් ඒ අධිකාරයට අගෞරව කිරීමේ වරදට ඔහු වරදකරු විය යුතු ය.

5. (1) මේ පනතේ කාර්යය සඳහා (මෙහි මින් මතු " රෙජිස්ට්‍රාර්වරයා " යනුවෙන් සඳහන් කරනු ලබන) පොදු කොන්ත්‍රාත් ගිවිසුම් රෙජිස්ට්‍රාර්වරයා යනුවෙන් හඳුන්වනු ලබන එක් තැනැත්තකු ද සහකාර රෙජිස්ට්‍රාර්වරයන් ලෙස අවශ්‍ය යයි සලකනු ලබන වෙනත් යම් තැනැත්තන් සංඛ්‍යාවක් ද ජනාධිපතිවරයා විසින් පත් කරනු ලැබිය යුතු ය.

රෙජිස්ට්‍රාර්වරයා පත් කිරීම.

(2) රෙජිස්ට්‍රාර්වරයා වෙත මේ පනත යටතේ ප්‍රකාශිතව ම පවරණ ලද නැතහොත් නියම කරන ලද යම් බලයක් ක්‍රියාත්මක කිරීම නැතහොත් යම් කාර්යයක් හෝ කර්තව්‍යයක් ඉටු කිරීම සහකාර රෙජිස්ට්‍රාර්වරයකු ලෙස පත් කරනු ලැබූ යම් තැනැත්තකු විසින් කරනු ලැබිය හැකි ය.

6. (1) රෙජිස්ට්‍රාර්වරයාගේ කාර්ය—

රෙජිස්ට්‍රාර්වරයාගේ කාර්ය.

(අ) (i) සෑම ටෙන්ඩර්කරුවකුම හෝ ඒ ටෙන්ඩර්කරු සඳහා සහ වෙනුවෙන් අනුයෝජිතයකු, උප අනුයෝජිතයකු, නියෝජිතයකු නැතහොත් නාමිකයකු ලෙස ක්‍රියා කරන සෑම තැනැත්තකුම ;

(ii) සෑම පොදු කොන්ත්‍රාත් ගිවිසුමක් ම

ලියාපදිංචි කිරීම ; සහ

(ආ) මෙහි දෙවන උපලේඛනයෙහි සඳහන් යම් විස්තර, යථා පරිදි දිවුරන ලද දිවුරුම් ප්‍රකාශයක් ද සමග සපයන ලෙස (අ) ඡේදයේ (i) වන අනුඡේදයේ සඳහන් තැනැත්තකුට නියම කිරීම ;

(ඇ) (ආ) ඡේදය යටතේ සපයන ලද විස්තර ඇතුළත් විය යුතු ලේඛන එකක් හෝ වැඩි ගණනක් පවත්වා ගෙන යාම ;

සහ

(ඈ) (අ) ඡේදයේ (i) වන අනුඡේදය යටතේ ලියාපදිංචි කරන ලද යම් තැනැත්තකුට —

(i) මේ පනත සහ මේ පනත යටතේ සාදන ලද නියෝග නිසියාකාරව ක්‍රියාවෙහි යෙදවීම සහ පරිපාලනය කිරීම සඳහා අවශ්‍ය යයි රෙජිස්ට්‍රාර්වරයා සලකන පොත් සහ වාර්තා පවත්වාගෙන යන ලෙස නියම කිරීම ; සහ

(ii) ඔවුන්ගේ මූල්‍ය තත්ත්වය, යෝජිත පොදු කොන්ත්‍රාත් ගිවිසුමෙහි ස්වභාවය සහ රෙජිස්ට්‍රාර්වරයා අවශ්‍ය යයි සලකන වෙනත් යම් කරුණු පිළිබඳව වාර වාර්තා රෙජිස්ට්‍රාර්වරයා වෙත ඉදිරිපත් කරන ලෙස නියම කිරීම

විය යුතු ය.

(2) රෙජිස්ට්‍රාර්වරයා විසින් (1) වන උපවගන්තියේ (ඈ) ඡේදය යටතේ පවත්වා ගෙන යනු ලබන ලේඛනවල, අවශ්‍ය විය හැකි සියලු නිවැරදි කිරීම්, එකතු කිරීම් සහ වෙනස් කිරීම් කලින් කල කරනු ලැබිය යුතු ය.

ලේඛනය සාක්ෂිය විය යුතු බව.

7. රෙජිස්ට්‍රාර්වරයා විසින් පවත්වා ගෙන යනු ලබන ලේඛනයෙහි සටහන් කර ඇති විස්තර, ඒ ලේඛනවල ඇතුළත් කළ යුතු යයි මේ පනතින් විධාන කරන ලද හෝ බලය දෙන ලද යම් කාරණා සම්බන්ධයෙන් මුල් බැල්මට පෙනෙන සාක්ෂි විය යුතු ය.

## II වන කොටස

### ලියාපදිංචි කිරීම

රෙජිස්ට්‍රාර්වරයා වෙත ලියාපදිංචි වීමට නියමිත තැනැත්තෝ.

8. (1) යම් ටෙන්ඩර්කරුවකු සඳහා හෝ වෙනුවෙන් අනුයෝජිතයකු, උප අනුයෝජිතයකු, නියෝජිතයකු හෝ නාමිකයකු ලෙස ක්‍රියා කරන යම් තැනැත්තකු හෝ විසින් 10වන වගන්තියට අනුකූලව, තමා ද ඒ පොදු කොන්ත්‍රාත් ගිවිසුම ද ලියා පදිංචි කර ගනු ලැබිය යුතු අතර, 6 වන වගන්තිය යටතේ සැපයීමට නියමිත විස්තර ද රෙජිස්ට්‍රාර්වරයා වෙත සපයනු ලැබිය යුතු ය.

(2) යම් තැනැත්තකු ටෙන්ඩර්කරුවකුගේ අනුයෝජිතයකු, උප අනුයෝජිතයකු, නියෝජිතයකු හෝ නාමිකයකු වන අවස්ථාවක, මේ වගන්තිය යටතේ තමා ද, පොදු කොන්ත්‍රාත් ගිවිසුම ද ලියා පදිංචි කරවා ගැනීමට පෙර, අනුයෝජිතයකු, උප අනුයෝජිතයකු, නියෝජිතයකු හෝ නාමිකයකු ලෙස තම පත්වීමේ සහතිකය ඔහු විසින් රෙජිස්ට්‍රාර්වරයා වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

8 වන වගන්තියෙහි විධිවිධාන කඩ කිරීම වරදක් බව.

9. (1) 8 වන වගන්තියෙහි විධිවිධාන කඩ කරන හෝ ඒ විධිවිධාන අනුව ක්‍රියා කිරීම පැහැර හරින හෝ සෑම තැනැත්තකු ම, වරදක් කරන අතර, ඒ සඳහා වරදකරු කරනු ලැබූ විට රුපියල් එක් ලක්ෂයක දඩයකට සහ අවුරුදු දෙකක් නොඉක්මවන කාලයක් බන්ධනාගාරගත කිරීමකට හෝ ඔහු යටත් විය යුතු ය.

(2) 8 වන වගන්තිය යටතේ ලියාපදිංචි වීමට නියමිත කිසිම තැනැත්තකු විසින්, මේ පනත යටතේ වූ වලංගු ලියාපදිංචි කිරීමේ සහතිකයක් පළමුවෙන් ඉදිරිපත් නොකර—

(අ) ලියාපදිංචි වීමේ කාර්යය සඳහා හැර, රෙජිස්ට්‍රාර්වරයා සමග ; හෝ

(ආ) පොදු මණ්ඩලයක හෝ එවැනි මණ්ඩලයක කාර්මික කමිටු වක, ටෙන්ඩර් මණ්ඩලයක හෝ අගැයුම් මණ්ඩලයක යම් සාමාජිකයකු සමග නැතහොත් එහි යම් නිලධරයකු හෝ සේවා නියුක්තයකු සමග හෝ යම් රාජ්‍ය නිලධරයකු සමග

පොදු කොන්ත්‍රාත් ගිවිසුමක් සම්බන්ධයෙන් කෙළින්ම හෝ අන් අයුරකින් කිසිම කටයුත්තක් කරනු නොලැබිය යුතු ය. එවැනි තැනැත්තකු එසේ කටයුතු කළහොත් නැතහොත් එසේ කටයුතු කිරීමට තැත් කළහොත් ඔහු වරදක් කරන අතර, ඒ සඳහා වරදකරු කරනු ලැබූ විට රුපියල් එක් ලක්ෂයක් නොඉක්මවන දඩයකට හෝ අවුරුදු දෙකක් නොඉක්මවන කාලයක් සඳහා බන්ධනාගාර ගත කිරීමකට හෝ ඒ තැනැත්තා යටත් විය යුතු ය.

**ලියාපදිංචි කිරීම සඳහා වූ ඉල්ලුම් පත්‍රය.**

**10.** (1) 8 වන වගන්තිය යටතේ ලියාපදිංචි කිරීම සඳහා වූ සෑම ඉල්ලුම් පත්‍රයක්ම නියමිත ආකෘතියෙහි විය යුතු අතර, එහි සඳහන් කර ඇති විස්තර තමාගේ උපරිම දැනුම අනුව සත්‍ය හා නිවැරදි බවට ඉල්ලුම්කරු විසින් කරනු ලබන ප්‍රකාශයක් ද එහි ඇතුළත් විය යුතු ය.

(2) ඉල්ලුම්කරු විසින් මේ පනතෙහි විධිවිධාන කිසිවක් කඩ කර නොමැති බවට සහ ඉල්ලුම් පත්‍රයෙහි සඳහන් කර ඇති විස්තර සත්‍ය හා නිවැරදි බවට රෙජිස්ට්‍රාර්වරයා සෑහීමට පත් වූ විට, රෙජිස්ට්‍රාර්වරයා විසින් ඉල්ලුම්කරු සහ ඒ ඉල්ලුම් පත්‍රය අදාළ වන පොදු කොන්ත්‍රාත් ගිවිසුම ලියාපදිංචි කරනු ලැබිය යුතු ය.

(3) නියමිත ගාස්තුව, රෙජිස්ට්‍රාර්වරයා වෙත ගෙවනු ලබන තුරු කිසිම තැනැත්තකු ලියාපදිංචි කිරීම හෝ 11 වන වගන්තිය යටතේ ඒ තැනැත්තා වෙත සහතිකයක් නිකුත් කිරීම හෝ කරනු නො ලැබිය යුතු ය.

**ලියාපදිංචි කිරීමේ සහතිකය.**

**11.** (1) 10 වන වගන්තිය අනුව ක්‍රියා කිරීමෙහි ලා ලියාපදිංචි කිරීමක් කර ඇති අවස්ථාවක, රෙජිස්ට්‍රාර්වරයා විසින් නියමිත ආකෘතියෙහි වූ සහතිකයක් ඒ ඉල්ලුම්කරු වෙත නිකුත් කරනු ලැබිය යුතු ය.

(2) මේ පනතේ විධිවිධාන නිසි පරිදි ක්‍රියාවෙහි යෙදවීම සඳහා අවශ්‍ය යයි රෙජිස්ට්‍රාර්වරයා සලකන තොරතුරු කිසිවක් නිසැකව දැන ගැනීම පිණිස, ලියාපදිංචි කරනු ලැබීම සඳහා ඉල්ලුම් කර ඇති හෝ ලියාපදිංචි කරනු ලැබ සිටින තැනැත් තන්ට හෝ වෙනත් යම් තැනැත්තකුට තමන් ඉදිරියෙහි පැමිණ සිටින ලෙස, රෙජිස්ට්‍රාර්වරයා විසින් ඕනෑම වේලාවක නියම කරනු ලැබිය හැකි ය. තවද, ඒ රෙජිස්ට්‍රාර්වරයා විසින් ඒ තැනැත්තා දිවුරුම් පිට හෝ සහතික පිට විභාග කිරීම ද කළ හැකි ය.

(3) මේ වගන්තිය යටතේ නිකුත් කරන ලද සහතිකයක්, 14 වන වගන්තියේ විධිවිධානවලට යටත්ව ඒ සහතිකය දෙන ලද අවස්ථාවේ සිට, එක් අවුරුදු කාලයක් සඳහා බලාත්මකව පැවතිය යුතු අතර, එය නියමිත ගාස්තුව ගෙවනු ලැබූ විට එක් අවුරුදු වැඩි දුර කාලයක් සඳහා කලින් කල අලුත් කරනු ලැබිය හැකි ය.

**සාමාජිකයන්ට හා නිලධරයන්ට කොන්ත්‍රාත්කරුවන් සහ අනුයෝජිතයන් සමග කටයුතු කිරීම තහනම් බව.**

12. 8 වන වගන්තියේ සඳහන් තැනැත්තන් විසින්, මේ පනත යටතේ නිකුත් කරන ලද වලංගු ලියාපදිංචි කිරීමේ සහතිකයක් පළමුවෙන් තමා වෙත ඉදිරිපත් කරනු ලැබුවහොත් මිස, පොදු මණ්ඩලයක හෝ ඒ මණ්ඩලයේ කාර්මික කමිටුවක, ටෙන්ඩර් මණ්ඩලයක හෝ අගැයීම් මණ්ඩලයක යම් සාමාජිකයකු විසින් හෝ එහි යම් නිලධරයකු නැතහොත් සේවා නියුක්තයකු විසින් නැතහොත් යම් රාජ්‍ය නිලධරයකු හෝ රෙජිස්ට්‍රාර්වරයා විසින් ලියාපදිංචි කිරීමේ කාර්යය සඳහා හැර, යම් පොදු කොන්ත්‍රාත් ගිවිසුමකින් උද්ගත වන්නා වූ හෝ එවැනි කොන්ත්‍රාත් ගිවිසුමකට අදාළ වන්නා වූ යම් කාරණයක් සම්බන්ධයෙන් 8 වන වගන්තියේ සඳහන් යම් තැනැත්තකු සමග කිසිම කටයුත්තක් කරනු නොලැබිය යුතු ය. මේ වගන්තියෙහි විධිවිධාන කඩ කරන යම් තැනැත්තකු වරදකට වරදකරු විය යුතු ය.

**6 වන වගන්තිය යටතේ සපයන ලද විස්තරවල වෙනස්වීම පිළිබඳ දැනුම් දීම.**

13. 6 වන වගන්තිය යටතේ රෙජිස්ට්‍රාර්වරයා වෙත සපයන ලද විස්තරවල කිසියම් වෙනසක් වූ කවර විටක, ඒ වෙනස සිදු වී දින හැටක කාලයක් ඇතුළත ඒ වෙනස පිළිබඳව, රෙජිස්ට්‍රාර්වරයා වෙත දැනුම් දීම, 10 වන වගන්තිය යටතේ ලියාපදිංචි කරනු ලැබූ යම් තැනැත්තකුගේ යුතුකම විය යුතු ය.

**වංචා කිරීම හෝ වෙනත් හේතු මත ලියාපදිංචිය අවලංගු කිරීම.**

14. (1) මේ පනත යටතේ ලියාපදිංචි කරන ලද යම් තැනැත්තකුගේ ලියාපදිංචිය—

(අ) වංචා කිරීමෙන් හෝ කරුණු වරදවා දැක්වීමෙන් හෝ ඒ ලියාපදිංචිය ලබා ගෙන ඇති අවස්ථාවක ;

(ආ) කිසියම් පොදු කොන්ත්‍රාත් ගිවිසුමකට අදාළව නැතහොත් ඒ කොන්ත්‍රාත් ගිවිසුමෙහි නියම හෝ කොන්දේසි කිසිවක් ඉටු කිරීම සම්බන්ධයෙන් කපටකමක් හෝ අයුතු ක්‍රියාවක් ඒ තැනැත්තා විසින් කරනු ලැබ ඇති අවස්ථාවක ;

(ඇ) මේ පනත හෝ මේ පනත යටතේ සාදන ලද යම් නියෝගයක් හෝ යටතේ යම් වරදකට ඒ තැනැත්තා වරදකරු කරනු ලැබ ඇති අවස්ථාවක ;

(ඈ) සහතිකයෙහි සඳහන් නියම හෝ කොන්දේසි කිසිවක් ඒ තැනැත්තා විසින් කඩ කර ඇති අවස්ථාවක ; හෝ

(ඉ) 13 වන වගන්තිය යටතේ සපයන ලද විස්තරවල කිසියම් වෙනසක් දක්වා සිටීම ඒ තැනැත්තා විසින් පැහැර හරිනු ලබන අවස්ථාවක

රෙජිස්ට්‍රාර්වරයා විසින්, සිය මෙහෙයවීමෙන්ම අවලංගු කරනු ලැබිය හැකිය ; නැතහොත් අත්හිටවනු ලැබිය හැකි ය.

(2) යම් තැනැත්තකුගේ ලියාපදිංචිය (1) වන උපවගන්තිය යටතේ රෙජිස්ට්‍රාර්වරයා විසින් අවලංගු කරනු ලැබ හෝ අත්හිටුවනු ලැබ හෝ ඇති අවස්ථාවක, ඒ අනුව ඒ තැනැත්තා ලියාපදිංචිව සිටීම අවසන් විය යුතු අතර, අවස්ථාවෝචිත පරිදි, ඒ අවලංගු කිරීම හෝ අත්හිටුවීම පිළිබඳව රෙජිස්ට්‍රාර්වරයා විසින් ඒ තැනැත්තා වෙත ලියවිල්ලකින් දැනුම් දෙනු ලැබිය යුතු ය.

(3) මේ වගන්තිය යටතේ යම් තැනැත්තකුගේ ලියාපදිංචිය අවලංගු කිරීමට හෝ අත්හිටුවීමට හෝ පෙර රෙජිස්ට්‍රාර්වරයා විසින්—

(අ) ඒ තැනැත්තාට විරුද්ධව ඇති පැමිණිල්ල පිළිබඳව ලියවිල්ලකින් වූ දැන්වීමක් ලියාපදිංචි කළ තැපැලෙන් ලේඛනයෙහි සඳහන් ලිපිනයට ඔහු වෙත යවනු ලැබිය යුතු ය; තවද,

(ආ) පැමිණිල්ලේ කාරණය සම්බන්ධයෙන් විභාගයක් පවත්වනු ලැබිය යුතු අතර, පෞද්ගලිකව පැමිණ හෝ ලියවිල්ලකින් හෝ නිදහසට කරුණු කියා සිටීමේ සහ සාක්ෂි කැඳවීමේ අවස්ථාවක් ඒ තැනැත්තාට ලබා දිය යුතු ය.

රෙජිස්ට්‍රාර්වරයාගේ තීරණයට විරුද්ධව අභියාචනය කිරීම.

15. (1) යම් අවලංගු කිරීමක් හෝ අත්හිටුවීමක් සම්බන්ධයෙන් රෙජිස්ට්‍රාර්වරයා විසින් 14 වන වගන්තිය යටතේ කරන ලද තීරණයකින් අතෘප්තියට පත් යම් තැනැත්තකු විසින් ඒ අවලංගු කිරීම හෝ අත්හිටුවීම සම්බන්ධයෙන් රෙජිස්ට්‍රාර්වරයා විසින් ඒ තැනැත්තාට දැනුම් දෙනු ලැබීමෙන් දින දහහතරක් ඇතුළත ඒ තීරණයට විරුද්ධව අභියාචනාධිකරණය වෙත අභියාචනය කළ හැකි ය.

(2) මේ වගන්තිය යටතේ වූ අභියාචනා සම්බන්ධයෙන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 136 වන ව්‍යවස්ථාව යටතේ රීති සාදනු ලබන තෙක්, අභියාචනාධිකරණය වෙත කරනු ලබන ප්‍රතිශෝධන වශයෙන් වූ ඉල්ලීම්වලට අදාළව ඒ ව්‍යවස්ථාව යටතේ සාදනු ලැබූ රීති, මේ වගන්තිය යටතේ වූ සෑම අභියාචනයක් සම්බන්ධයෙන් ම අදාළ විය යුතු ය.

(3) මේ වගන්තිය යටතේ අභියාචනාධිකරණය වෙත ඉල්ලීමක් කරනු ලැබූ විට අභියාචනාධිකරණය විසින්, එම අභියාචනය කරනු ලැබ ඇත්තේ යම් තීරණයකට විරුද්ධව ද ඒ තීරණය ස්ථිර කිරීම, ප්‍රතිශෝධනය කිරීම, සුළු වශයෙන් වෙනස් කිරීම හෝ අවලංගු කිරීම සහ යුක්තිය ඉටුවීම සඳහා අවශ්‍ය වෙනත් යම් ආඥාවක් කිරීම හෝ කළ හැකි ය.

කොන්ත්‍රාත් ගිවිසුමක් අවලංගු කර හෝ අත්හිටුවා තිබුණ ද ඒ යටතේ වූ බැඳීම් ඉටු කිරීම.

**16.** පොදු කොන්ත්‍රාත් ගිවිසුමක එක් පාර්ශ්වකරුවකුගේ ලියාපදිංචිය අවලංගු කර හෝ අත්හිටුවා හෝ තිබුණ ද, ලියාපදිංචිය අවලංගු කරනු හෝ අත්හිටවනු ලැබූ පාර්ශ්වකරුට පවත්නා කොන්ත්‍රාත් ගිවිසුම යටතේ ඇති බැඳීම් ඉටු කරන ලෙස ඒ කොන්ත්‍රාත් ගිවිසුමේ අනෙක් පාර්ශ්වකරු විසින් ඔහුට නියම කළ හැකි අතර, මේ පනතේ විධිවිධාන කෙසේ වුව ද, ඒ කොන්ත්‍රාත් ගිවිසුම යටතේ ඒ තැනැත්තාගේ බැඳීම් ඉටු කිරීමේ කාර්යය සඳහා අවශ්‍ය සියලු ක්‍රියා කිරීමට ඒ තැනැත්තාට හිමිකම තිබිය යුතු ය.

## III වන කොටස

### පොදු කොන්ත්‍රාත් ගිවිසුමක් පිරිනමනු ලැබීම සඳහා නැතහොත් ටෙන්ඩර් ප්‍රදානය කරනු ලැබීම සඳහා පෙළඹවීම්, තුටුපඬුරු දීම් යනාදිය

ටෙන්ඩර් සහ පොදු කොන්ත්‍රාත් ගිවිසුම් ප්‍රදානය කිරීමේදී වාසි ලබා ගැනීම සඳහා යම් තැනැත්තකුට කරනු ලබන පෙළඹවීම්, තුටුපඬුරු පිරිනැමීම් හෝ කරුණු වරදවා දැක්වීම.

**17.** (1) යම් පොදු කොන්ත්‍රාත් ගිවිසුමකට ඇතුළත්වීම පිණිස හෝ යම් ටෙන්ඩරයක් ප්‍රදානය කිරීම පිණිස හෝ යම් පොදු කොන්ත්‍රාත් ගිවිසුමක් සඳහා හෝ සම්බන්ධයෙන් යම් තැනැත්තකුට කිසියම් පක්ෂග්‍රාහී බවක් දැක්වීම නැතහොත් වරප්‍රසාදයක් සැලසීම පිණිස හෝ රෙජිස්ට්‍රාර්වරයා හෝ මූල මණ්ඩලයෙහි, විනිශ්චයාධිකාරයෙහි හෝ පොදු මණ්ඩලයක නැතහොත් එවැනි මණ්ඩලයක කාර්මික කමිටුවෙහි, ටෙන්ඩර් මණ්ඩලයෙහි හෝ අගැයීම් මණ්ඩලයෙහි යම් සාමාජිකයකු හෝ එහි යම් සේවා නියුක්තයකු නැතහොත් නිලධරයකු හෝ යම් රාජ්‍ය නිලධරයකු හෝ වෙනත් යම් තැනැත්තකු මෙහෙයවීමේ හෝ පෙළඹවීමේ කාර්යය සඳහා ඒ රෙජිස්ට්‍රාර්වරයාට හෝ එවැනි යම් සාමාජිකයකුට, සේවා නියුක්තයකුට, නිලධරයකුට, රාජ්‍ය නිලධරයකුට හෝ වෙනත් යම් තැනැත්තකුට පොදු කොන්ත්‍රාත් ගිවිසුමකට අදාළ කිසියම් ගනුදෙනුවක දී හෝ ඒ කොන්ත්‍රාත් ගිවිසුම පවත්නා කාලය තුළ යම් අවස්ථාවක දී—

(අ) කවර වූ හෝ ආකාරයක යම් තුටු පඬුරක් පිරිනමන හෝ දෙන ;

(ආ) චේතනාන්විතව ම යම් කරුණු වරදවා දැක්වීමක් කරන ;

(ඇ) යම් චංචල හෝ නිශ්චල දේපළක් ලබා ගන්නා, පිරිනමන හෝ පවරන ;

(ඈ) ශ්‍රී ලංකාවේ හෝ අන් තැනක දී යම් ශිෂ්‍යත්වයක්, තෑග්ගක් හෝ වෙනත් යම් ආකාරයක ප්‍රතිලාභයක් හෝ ප්‍රතිෂ්ඨාවක් පිරිනමන හෝ දෙන

යම් තැනැත්තකු වරදක් කරන අතර, වරදකරු කරනු ලැබූ විට රුපියල් එක් ලක්ෂයකට අඩු නොවන දඩයකට සහ අවුරුදු දෙකකට අඩු නොවන්නා වූ ද අවුරුදු පහක් නොඉක්ම වන්නා වූ ද කාලයක් සඳහා බන්ධනාගාරගත කිරීමකට ඔහු යටත් විය යුතු ය.

(2) (1) වන උපවගන්තිය යටතේ වූ වරදක් සම්බන්ධයෙන් වරදකරු කරනු ලැබූ තැනැත්තකු මේ පනත යටතේ ලියාපදිංචි කරනු ලැබූ තැනැත්තකු වන අවස්ථාවක, (1) වන උපවගන්තිය යටතේ නියම කරන ලද යම් දණ්ඩනයකට අතිරේකව, ඒ උපවගන්තිය යටතේ නියම කරන ලද මුදලට සමාන වැඩිදුර දණ්ඩනයකට ද ඒ තැනැත්තා යටත් විය යුතු ය.

(3) කිසියම් පොදු කොන්ත්‍රාත් ගිවිසුමකට අදාළ කිසියම් ගනුදෙනුවක දී රෙජිස්ට්‍රාර්වරයා හෝ මූල මණ්ඩලයෙහි හෝ විනිශ්චයාධිකාරයක හෝ පොදු මණ්ඩලයක යම් සාමාජිකයකු හෝ එවැනි මණ්ඩලයක කාර්මික කමිටුවක, ටෙන්ඩර් මණ්ඩලයක හෝ අගැයීම් මණ්ඩලයක යම් සාමාජිකයකු හෝ එහි යම් නිලධරයකු නැතහොත් සේවා නියුක්තයකු හෝ යම් රාජ්‍ය නිලධරයකු හෝ වෙනත් යම් තැනැත්තකු විසින් කවර වූ හෝ ආකාරයක යම් පෙළඹවීමක් නැතහොත් තුටුපඬුරක් භාරගෙන ඇති හෝ කිසියම් චංචල හෝ නිශ්චල දේපළක් භාරගෙන නැතහොත් ලබා ගෙන ඇති හෝ (1) වන උපවගන්තිය කඩ කරමින් ශ්‍රී ලංකාවෙහි හෝ අන් තැනක හෝ මුවද පිරිනමන ලද, කරන ලද හෝ දෙන ලද කිසි යම් ශිෂ්‍යත්වයක්, තෑග්ගක් හෝ වෙනත් යම් ආකාරයක ප්‍රතිලාභයක් හෝ ප්‍රතිඥාවක් භාරගෙන නැතහොත් ලබාගෙන ඇති අවස්ථාවක, ඒ රෙජිස්ට්‍රාර්වරයා, සාමාජිකයා, නිලධරයා, සේවා නියුක්තයා, රාජ්‍ය නිලධරයා හෝ වෙනත් යම් තැනැත්තා වරදක් කරන අතර, වරදකරු කරනු ලැබූ විට රුපියල් එක් ලක්ෂයකට අඩු නොවන දණ්ඩනයකට සහ අවුරුදු දෙකකට අඩු නොවන්නා වූ ද අවුරුදු පහක් නොඉක්මවන්නා වූ ද කාලයක් සඳහා බන්ධනාගාරගත කිරීමකට ඔහු යටත් විය යුතු ය.

(4) පොදු කොන්ත්‍රාත් ගිවිසුමක් පිරිනැමීමේ දී පෙළඹවීමක්, තුටුපඬුරක්, චංචල හෝ නිශ්චල දේපළ පැවරීමක්, හෝ ශිෂ්‍යත්වයක්, තෑග්ගක් නැතහොත් වෙනත් යම් ආකාරයක ප්‍රතිලාභයක් හෝ ප්‍රතිඥාවක් වැදගත් සාධකයක් ලෙස ක්‍රියා කර ඇතැයි ද ඒ හේතුවෙන් රෙජිස්ට්‍රාර්වරයා හෝ මූල මණ්ඩලයෙහි හෝ විනිශ්චයාධිකාරයක හෝ පොදු මණ්ඩලයක යම් සාමාජිකයකු හෝ එවැනි මණ්ඩලයක කාර්මික කමිටුවෙහි, ටෙන්ඩර් මණ්ඩලයෙහි නැතහොත් අගැයීම් මණ්ඩලයෙහි යම් සාමාජිකයකු හෝ එහි යම් සේවා නියුක්තයකු නැතහොත් නිලධරයකු හෝ යම් රාජ්‍ය නිලධරයකු හෝ වෙනත් යම් තැනැත්තකු විසින් කිසියම් ද්‍රව්‍යමය වාසියක් හෝ ප්‍රතිලාභයක් කෙළින්ම හෝ අන් අයුරකින් ලබා ගෙන ඇතැයි ද මේ වගන්තිය යටතේ වූ යම් නඩු කටයුත්තක දී සාක්ෂි ඉදිරිපත් කරනු ලැබ ඇති අවස්ථාවක ඊට පටහැනිව කරුණු ඔප්පු කරනු නොලැබුවහොත්, පෙළඹවීමක්, තුටුපඬුරක්, චංචල හෝ නිශ්චල දේපළ පැවරීමක් හෝ ශිෂ්‍යත්ව ප්‍රදානයක් හෝ වෙනත් යම් ආකාරයක ප්‍රතිලාභයක් හෝ ප්‍රතිඥාවක් පිරිනමනු ලැබුවේ හෝ කරනු ලැබුවේ හෝ දෙනු ලැබුවේ යම් තැනැත්තකුට ද, පොදු කොන්ත්‍රාත් ගිවිසුමට ඇතුළුවීම පිණිස ඒ තැනැත්තා පෙළඹවීමේ කාර්යය සඳහා එසේ කරන ලදැයි පූර්ව නිගමනය කළ යුතු ය.

රෙජිස්ට්‍රාර්වරයා කෙරෙහි හෝ මූල මණ්ඩලය, විනිශ්චයාධිකාරය හෝ පොදු මණ්ඩලය යනාදියෙහි සාමාජිකයන් කෙරෙහි බැඳීගත් වීම

**18.** (1) මේ පනත යටතේ හෝ යම් පොදු කොන්ත්‍රාත් ගිවිසුමක් සම්බන්ධයෙන් හෝ ඒ කොන්ත්‍රාත් ගිවිසුම පවත්නා කාලය තුළ යම් අවස්ථාවක දී හෝ ස්වකීය බලතල ක්‍රියාත්මක කිරීමේ දී සහ කර්තව්‍ය හා කාර්ය ඉටු කිරීමේ දී—

(අ) රෙජිස්ට්‍රාර්වරයාට හෝ මූල මණ්ඩලයේ හෝ විනිශ්චයාධිකාරයක යම් සාමාජිකයකුට ;

(ආ) පොදු මණ්ඩලයක හෝ ඒ මණ්ඩලයේ කාර්මික කමිටුවේ, ටෙන්ඩර් මණ්ඩලයේ හෝ අගැයීම් මණ්ඩලයේ යම් සාමාජිකයකුට හෝ එහි යම් නිලධරයකුට නැතහොත් සේවා නියුක්තයකුට ;

(ඇ) යම් රාජ්‍ය නිලධරයකුට ; හෝ

(ඈ) වෙනත් යම් තැනැත්තකුට

ඉකල්ලීම් හෝ අන් අයුරකින් හෝ, තමා විසින් ම හෝ වෙනත් යම් තැනැත්තකු මගින්, ශ්‍රී ලංකාවේ දී හෝ අන් තැනක දී ස්වකීය කාර්යය ඉටු කිරීමේ දී හැර, කවර හෝ ආකාරයකින් බලපෑමක් කරන්නා වූ හෝ නැතහොත් බලපෑමක් කිරීමට තැත් කරන්නා වූ සෑම තැනැත්තකුම වරදක් කරන අතර, වරදකරු කරනු ලැබූ විට රුපියල් එක් ලක්ෂයක දඩයකට හෝ අවුරුදු දෙකක් නොඉක්මවන කාලයක් සඳහා බන්ධනාගාරගත කිරීමකට හෝ ඔහු යටත් විය යුතු ය.

(2) (1) වන උපවගන්තියෙහි සඳහන් යම් ස්ථානයක දී සිදු කරන ලද යම් වරදක්, අභියාචනාධිකරණයේ සභාපතිවරයා විසින් ස්වකීය අත්සන යටතේ වූ ලියවිල්ලක් මගින් විධාන කරනු ලබන අධිකරණ කලාපයේ මහාධිකරණයෙහි විභාග කරනු ලැබිය යුතු ය.

**වාර්තා කිරීම යුතුකම බව**

19. (1) ස්වකීය බලතල ක්‍රියාත්මක කිරීමේ දී සහ කාර්ය හා කර්තව්‍ය ඉටු කිරීමේ දී මේ පනතේ විධිවිධාන අතුරින් යම් විධිවිධානයක් හෝ මේ පනත යටතේ සාදන ලද යම් නියෝගයක් හෝ කඩ කරමින් යම් තැනැත්තකු විසින් යම් ක්‍රියාවක් හෝ ක්‍රියා කිරීම හෝ කිරීමට තැත් කිරීම පිළිබඳව ජනාධිපතිවරයා වෙත නොපමාව වාර්තා කිරීම—

(අ) රෙජිස්ට්‍රාර්වරයාගේ හෝ පොදු මණ්ඩලයක නැතහොත් පොදු මණ්ඩලයක කාර්මික කමිටුවෙහි, ටෙන්ඩර් මණ්ඩලයෙහි හෝ අගැයීම් මණ්ඩලයෙහි යම් සාමාජිකයකුගේ, නිලධරයකුගේ හෝ සේවා නියුක්තයකුගේ ;

(ආ) යම් රාජ්‍ය නිලධරයකුගේ ; හෝ

(ඇ) වෙනත් යම් තැනැත්තකුගේ

යුතුකම විය යුතු ය.

(2) (1) වන උපවගන්තිය යටතේ වාර්තාවක් ලැබුණු විට, ඒම [illegible] යෙන් පවින [illegible] ගෙන යාම් සඳහා 3 වන වගන්තියේ (3) වන උපවගන්තිය යටතේ විනිශ්චයාධිකාරයක් ජනාධිපතිවරයා විසින් නම් කරනු ලැබිය හැකි ය.

(3) (1) වන උපවගන්තියේ සඳහන් විධිවිධාන අනුව ක්‍රියා කිරීම පැහැර හරින, ඒ වගන්තියෙහි සඳහන් යම් තැනැත්තකු වරදක් කරන අතර, වරදකරු කරනු ලැබූ විට රුපියල් එක් ලක්ෂයක දඩයකට හෝ අවුරුදු දෙකක් නොඉක්මවන කාලයක් සඳහා බන්ධනාගාරගත කිරීමකට හෝ ඔහු යටත් විය යුතු ය.

(4) (1) වන උපවගන්තිය යටතේ යම් තැනැත්තකු විසින් ඉදිරිපත් කරනු ලබන වාර්තාවක් සම්බන්ධයෙන් ඒ තැනැත්තාට විරුද්ධව කිසිදු සිවිල් හෝ අපරාධ නඩුවක් පවරනු නොලැබිය යුතු ය.

(5) ජනාධිපතිවරයාගේ ලියවිල්ලකින් වූ අනුමතය ඇතිව මිස, (1) වන උපවගන්තිය යටතේ කරන ලද යම් වාර්තාවක ඇතුළත් කරුණුවලට කෙළින්ම හෝ අන් අයුරකින් සඳහන් කිරීමක් ඇති යම් වාර්තාවක් හෝ ප්‍රකාශයක් මුද්‍රණය කිරීම හෝ පළ කිරීම කිසිම තැනැත්තකු විසින් නොකළ යුතු ය.

(6) (4) වන උපවගන්තියේ විධිවිධාන කඩ කරන යම් තැනැත්තකු වරදක් කරන අතර, වරදකරු කරනු ලැබූ විට රුපියල් එක් ලක්ෂයක දඩයකට හෝ අවුරුදු දෙකක් නොඉක්මවන කාලයක් සඳහා බන්ධනාගාරගත කිරීමකට හෝ ඔහු යටත් විය යුතු ය.

විනිශ්චයාධිකාරය වෙත ආයාචනය කිරීමට ඇති අයිතිය.

20. (1) යම් පොදු කොන්ත්‍රාත් ගිවිසුමක් සම්බන්ධයෙන් අවශ්‍ය පිරිවිතරවලට හෝ පර්ව සුදුසුකම්වලට හෝ පටහැනිව ඒ කොන්ත්‍රාත් ගිවිසුමට ඇතුළත් වී ඇතැයි හෝ ටෙන්ඩරයක් පිරිනැමීම සඳහා සීමාකාරී පිරිවිතර දක්වා ඇතැයි නැතහොත් මේ පනතේ විධිවිධානවලට පටහැනිව යම් පොදු කොන්ත්‍රාත් ගිවිසුමකට ඇතුළත්ව ඇතැයි කියනු ලබන අවස්ථාවක ඒ කොන්ත්‍රාත් ගිවිසුම ප්‍රදානය කිරීමේ හේතුවෙන් අතෘප්තියට පත් යම් තැනැත්තකු විසින්, ඒ කොන්ත්‍රාත් ගිවිසුම පිළිබඳව විමර්ශනයක් පවත්වා ගෙන යාම පිණිස 3 වන වගන්තියේ (3) වන උපවගන්තිය යටතේ විනිශ්චයාධිකාරයක් පත් කරන ලෙස යථා පරිදි දිවුරන ලද දිවුරුම් ප්‍රකාශයක් සමග වූ ලියවිල්ලකින් වූ පෙත්සමක් මගින් ජනාධිපතිවරයාගෙන් ඉල්ලා සිටිනු ලැබිය හැකි ය.

(2) 6 වන වගන්තියේ හා මේ වගන්තියේ කාර්ය සඳහා "යථා පරිදි දිවුරන ලද දිවුරුම් ප්‍රකාශය" යන්නෙන්, සිද්ධි ප්‍රකාශක පෞද්ගලිකව දන්නා සිද්ධි හා අවස්ථානුගත කරුණු දක්වන, සමාදාන විනිශ්චයකාරවරයකු හෝ අධිකරණ නිලධරයකු හෝ ඉදිරියෙහි දිවුරනු ලැබුවා වූ නැතහොත් සහතික කරනු ලැබුවා වූ දිවුරුම් ප්‍රකාශයක් අදහස් වේ.

(3) (1) වන උපවගන්තිය යටතේ පෙත්සමක් ලැබුණු විට, විමර්ශනයක් පවත්වාගෙන යාම සඳහා 3 වන වගන්තියේ (3) වන උපවගන්තිය යටතේ විනිශ්චයාධිකාරයක් ජනාධිපතිවරයා විසින් නම් කරනු ලැබිය හැකි ය.

විනිශ්චයාධිකාරය විසින් ජනාධිපතිවරයා වෙත වාර්තා කළ යුතු බව.

21. මේ පනත යටතේ පවත්වන ලද විමර්ශනයක් අවසන් කරනු ලැබූ කල්හි, විනිශ්චයාධිකාරය විසින් එහි තීරණ පිළිබඳ වාර්තාවක් නොපමාව ජනාධිපතිවරයා වෙත ඉදිරිපත් කළ යුතු ය.

විනිශ්චයාධිකාරය විසින් නීතිපතිවරයා වෙත වාර්තාව ඉදිරිපත් කළ යුතු බව.

22. (1) මේ පනත යටතේ වූ විමර්ශනයක දී යම් තැනැත්තකු වරදකට වරදකරු වී ඇති බව විනිශ්චයාධිකාරයට පෙනී යන අවස්ථාවක, විනිශ්චයාධිකාරය විසින් සිය මෙහෙයවීමෙන් ම, එම කරුණ නීතිපතිවරයා වෙත වාර්තා කරනු ලැබිය හැකි අතර, විනිශ්චයාධිකාරය සන්තකයෙහි හෝ එහි පාලනය යටතේ ඇති තොරතුරු ඔහු වෙත සැපයීම ද, යම් ප්‍රකාශ, තොරතුරු හෝ ලේඛන බැලීමට ඔහුට ඉඩ දීම ද, ඒවා පරීක්ෂා කිරීම සහ පිටපත් ගැනීම සඳහා ඔහුට පහසුකම් සැලසීම ද විනිශ්චයාධිකාරය විසින් කළ යුතු ය.

(2) (1) වන උපවගන්තිය යටතේ නීතිපතිවරයා වෙත ඉදිරිපත් කරන ලද යම් වාර්තාවක් අනුව එය නඩුවක් පැවරිය යුතු කාරණයක් බව නීතිපතිවරයාට පෙනී යන්නේ නම්, ඒ වාර්තාව ලැබී එක් මාසයක් ඇතුළත, ඔහු ඒ බව විනිශ්චයාධිකාරය වෙත දන්වා සිටිය යුතු අතර, ඉනික්බිති මාස දෙකක් ඇතුළත නඩු කටයුතු පවරනු ලැබිය යුතු ය. ඒ අනුව, නඩු පැවරීම හෝ නඩු කටයුතු සම්බන්ධයෙන් සියලු සහාය ඔහුට ලබා දීම, විනිශ්චයාධිකාරයේ කාර්යය විය යුතු ය :

එසේ වුවද, නඩුවේ අවස්ථානුගත කරුණු ගැන සලකන කල්හි මාස දෙකක කාලය ඇතුළත නඩු කටයුතු පැවරිය නොහැකි බව නීතිපතිවරයාගේ මතය වන අවස්ථාවක, ඔහු ඒ බව විනිශ්චයාධිකාරය වෙත දන්වා සිටිය යුතු අතර, ඒ නඩු කටයුත්ත මාස දෙකක කාලය ඇතුළත පවරා නොතිබීමේ හේතුව මත එය අවලංගු වෙතැයි සලකනු නොලැබිය යුතු ය.

(3) මේ වගන්තිය යටතේ වරදකරු කරනු ලැබූ තැනැත්තකු, මේ පනත යටතේ ලියාපදිංචි කරනු ලැබූ කොන්ත්‍රාත්කරුවකු, ටෙන්ඩර්කරුවකු නැතහොත් වෙනත් යම් තැනැත්තකු වන අවස්ථාවක, ඒ වරදකරු කිරීම පිළිබඳව අධිකරණය විසින් රෙජිස්ට්‍රාර්වරයා වෙත දැනුම් දිය යුතු අතර, එවිට ඒ රෙජිස්ට්‍රාර්වරයා විසින්—

(අ) ලේඛනයෙන් ඒ තැනැත්තාගේ නම කපා හැරිය යුතු ය ; සහ

(ආ) ඒ තැනැත්තා අවුරුදු හතක කාලයක් සඳහා ටෙන්ඩර්කරුවකු ලෙස හෝ වෙනත් කවර හෝ තත්ත්වයකින් රෙජිස්ට්‍රාර්වරයා වෙත ලියාපදිංචි වීම තහනම් කළ යුතු ය.

විශේෂිත තොරතුරු හෙළිදරව් කරන තැනැත්තෝ.

23. (1) යම් පොදු මණ්ඩලයක, කිසියම් තත්ත්වයකින් සේවයෙහි නියුක්තව සිටින අතරතුර විශේෂිත තොරතුරු කිසිවක් පිළිබඳ වැටහීම අත්කර ගැනීමේ හෝ ලබා ගැනීමේ අවස්ථාව ලබා ඒ තොරතුරු හෙළිදරව් කිරීමට තමාගේ යුතුකමක් ඇත්තේ යම් තැනැත්තකුට ද ඒ තැනැත්තා නොවන යම් තැනැත්තකුට ඒ තොරතුරු, පොදු කොන්ත්‍රාත් ගිවිසුමකට අදාළ යම් ටෙන්ඩරයක් පිරිනැමීමට පෙර හෝ පසුව, ශ්‍රී ලංකාවේ දී හෝ අන් තැනක දී සපයන යම් තැනැත්තකු වරදක් කරන අතර, වරදකරු කරනු ලැබූ විට රුපියල් එක් ලක්ෂයක දඩයකට හෝ අවුරුදු දෙකක් නොඉක්මවන කාලයක් සඳහා බන්ධනාගාරගත කිරීමකට හෝ ඔහු යටත් විය යුතු ය.

(2) මේ වගන්තියෙහි "විශේෂිත තොරතුරු" යන්නෙන්, යම් පොදු කොන්ත්‍රාත් ගිවිසුමකට අදාළ යම් සිද්ධි, තොරතුරු හෝ දැනුම, ලේඛන හෝ පරමාර්ථ අදහස් වේ.

## IV වන කොටස

### පොදු විධිවිධාන

24. (1) විනිශ්චයාධිකාරය විසින් පවත්වා ගෙන යනු ලබන යම් විමර්ශනයක දී සියලු සාක්ෂිකරුවන් කැඳවීමේ සහ ඔවුන් විභාග කිරීමේ බලය විනිශ්චයාධිකාරයට තිබිය යුතු ය. සෑම කැඳවීම් නියෝගයක් ම විනිශ්චයාධිකාරයේ සභාපතිවරයාගේ අත්සන යටතේ විය යුතු ය. සාක්ෂිකරුවන් කැඳවීමට ඇති බලය.

(2) කැඳවීම් නියෝගයක්, එහි නම් කර ඇති තැනැත්තා වෙත භාර දීමෙන් හෝ එය එසේ කළ නොහැකි නම් ඒ තැනැත්තාගේ වාසස්ථානය ලෙස අවසන් වරට දැන සිටි ස්ථානයෙහි තැබීමෙන් හෝ භාර දෙනු ලැබිය හැකි ය.

(3) කැඳවීම් නියෝගයක් භාර දෙනු ලැබුවේ යම් තැනැත්තකුට ද, ඒ සෑම තැනැත්තකු ම, එහි සඳහන් වේලාවේ දී සහ ස්ථානයේ දී විනිශ්චයාධිකාරය ඉදිරියෙහි පැමිණ සිටිය යුතු අතර, කැඳවීම් නියෝගයෙහි භාවය අනුව, සාක්ෂි දීම හෝ ඉදිරිපත් කරන ලෙස ඔහුට නියම කර ඇත්තා වූ ද, ඔහුගේ සන්තකයෙහි හෝ බලය යටතේ තිබෙන්නා වූ ද යම් ලේඛන හෝ වෙනත් දේ ඉදිරිපත් කිරීම හෝ ඔහු විසින් කරනු ලැබිය යුතු ය.

25. (1) මේ පනත යටතේ වූ යම් පරීක්ෂණ හෝ විමර්ශනයක කාර්යය සඳහා විනිශ්චයාධිකාරයට— සාක්ෂි.

(අ) ලබා ගැනීම, භාර ගැනීම හෝ විභාග කිරීම, අවශ්‍ය යයි හෝ යෝග්‍ය යයි විනිශ්චයාධිකාරය කල්පනා කරන ලිඛිත හෝ වාචික සියලු සාක්ෂි ලබා ගැනීමට හා භාර ගැනීමට සහ එවැනි සියලු තැනැත්තන් සාක්ෂිකරුවන් ලෙස විභාග කිරීමට ;

(ආ) යම් සාක්ෂිකරුවකුගේ ලිඛිත වූ හෝ වාචික වූ හෝ සාක්ෂි, ඒ සාක්ෂිකරු අධිකරණයක සාක්ෂි දෙන්නේ නම් ඔහු විසින් කළ යුතු දිවුරුමක් නැතහොත් ප්‍රතිඥාවක් විය යුතු දිවුරුමක් නැතහොත් ප්‍රතිඥාවක් මත දිය යුතු බවට නියම කිරීමට සහ එවැනි සෑම සාක්ෂිකරුවකු ම දිවුරවීමට හෝ ප්‍රතිඥා කරවීමට

බලය තිබිය යුතු ය.

(2) මේ පනත යටතේ විමර්ශනයක් කරගෙන යාමේ දී විනිශ්චයාධිකාරය විසින් ලබා ගනු ලැබ, එසේ ලබා ගත් බවට එහි සභාපතිවරයා විසින් සහතික කරන ලද ලිඛිත වූ හෝ වාචික වූ හෝ එවැනි සියලු සාක්ෂි, සාක්ෂි ආඥාපනතේ විධිවිධානවලට යටත්ව, සහ වෙනත් යම් නීතියක විධිවිධානවලට පටහැනිව කුමක් සඳහන්ව ඇත ද, මේ පනත යටතේ වූ වරදක් සඳහා වූ යම් නඩු පැවරීමක දී හෝ යම් නඩු කටයුත්තක දී චූදිත තැනැත්තකුට විරුද්ධව සාක්ෂ්‍යයේ දී ආවේශ්‍ය කර ගනු ලැබිය යුතු ය.

කැඳවීම් නියෝගයට කීකරු වීම හෝ සාක්ෂි දීම හෝ සනාදිය පැහැර හැරීම.

**26.** මේ පනත යටතේ කැඳවීම් නියෝගයක් බාර දෙනු ලැබුවේ යම් තැනැත්තකු වෙත ද, ඒ තැනැත්තා—

(අ) සාධාරණ යයි විනිශ්චයාධිකාරයේ මතය වන හේතුවක් නොමැතිව, කැඳවීම් නියෝගයෙහි සඳහන් වේලාවේ දී හා ස්ථානයේ දී විනිශ්චයාධිකාරය ඉදිරියෙහි පෙනී සිටීම පැහැර හරියි නම්; හෝ

(ආ) දිවුරවීම හෝ ප්‍රතිඥා කරවීම ප්‍රතික්ෂේප කරයි නම් හෝ යථා පරිදි දිවුරුම් කරනු ලැබ හෝ ප්‍රතිඥා කරනු ලැබ සාධාරණ යයි විනිශ්චයාධිකාරයේ මතය වන හේතුවක් නොමැතිව, පරීක්ෂා කරන ලෙස හෝ විමර්ශනය කරන ලෙස විනිශ්චයාධිකාරයට විධාන කරනු ලැබ ඇති කාරණා වලට අදාළව ඔහු වෙත නගන ලද කිසියම් ප්‍රශ්නයකට පිළිතුරු දීම ප්‍රතික්ෂේප කරයි නම් හෝ පැහැර හරියි නම්; හෝ

(ඇ) ඔහුගේ සන්තකයෙහි හෝ බලය යටතේ තිබෙන්නා වූ ද, විනිශ්චයාධිකාරයේ මතය අනුව පරීක්ෂා කරනු ලැබිය යුතු කාරණාවල සත්‍යතාව හෙළිදරව් කර ගැනීම සඳහා අවශ්‍ය වන්නා වූ ද, යම් ලේඛනයක් හෝ වෙනත් දෙයක් සාධාරණ යයි විනිශ්චයාධිකාරයේ මතය වන හේතුවක් නොමැතිව විනිශ්චයාධිකාරය වෙත ඉදිරිපත් කිරීම ප්‍රතික්ෂේප කරයි නම් හෝ පැහැර හරියි නම්

විනිශ්චයාධිකාරයට එරෙහිව අපහාස කිරීමේ හෝ විනිශ්චයාධිකාරයට අගෞරව කිරීමේ හෝ වරදට ඔහු වරදකරු විය යුතු ය.

අපහාස කිරීම් සම්බන්ධයෙන් දඬුවම.

**27.** (1) 26 වන වගන්තියෙහි විධිවිධාන කඩ කරමින් කරන ලද යම් ක්‍රියාවක් හෝ නොකර හැරීමක්, ඒ ක්‍රියාව හෝ නොකර හැරීම අභියාචනාධිකරණයට අදාළව කරන ලද්දක් නම් එය ඒ අධිකරණයේ අධිකාරයට එරෙහිව අපහාස කිරීමේ නැතහොත් අගෞරව කිරීමේ වරදක් බවට පත්වෙයි නම්, එය විනිශ්චයාධිකාරයට එරෙහිව අපහාස කිරීමේ නැතහොත් අගෞරව කිරීමේ වරදක් විය යුතු ය.

(2) (අ) ස්වකීය අධිකාරයට එරෙහිව අපහාස වන පරිදි නැතහොත් ඊට අගෞරව වන පරිදි යම් තැනැත්තකු විසින් වරදක් සිදු කර ඇති බවට විනිශ්චයාධිකාරය තීරණය කරන අවස්ථාවක, ඒ තීරණය දැක්වෙන සහතිකයක් සභාපතිවරයා විසින් අභියාචනාධිකරණය වෙත යවනු ලැබීමට විනිශ්චයාධිකාරය විසින් කටයුතු සැලැස්විය යුතු ය. එවැනි සෑම සහතිකයක් ම විනිශ්චයාධිකාරයේ සභාපතිවරයා විසින් අත්සන් කොට තිබිය යුතු ය.

(ආ) මේ වගන්තියෙහි විධිවිධාන සලසා ඇති පරිදි සැලකිල්ලට ගැනීම සුදුසු යයි අභියාචනාධිකරණය කල්පනා කරන අපහාස කිරීමේ වරදකට දඬුවම් කිරීම සඳහා වූ යම් නඩු කටයුත්තක දී, මේ උපවගන්තියේ ඉහතින් වූ විධිවිධාන යටතේ අත්සන් කොට අධිකරණය වෙත යවන ලද සහතිකයක් යයි කියනු ලබන යම් ලේඛනයක්—

(i) පටහැනිව කරුණු ඔප්පු කරනු ලැබුවහොත් මිස, සාක්ෂි විශයෙන් පිළිගනු ලැබිය යුතු අතර, වැඩිදුර ඔප්පු කිරීමක් නොමැතිව එවැනි සහතිකයක් ලෙස සලකනු ලැබිය යුතු ය; තවද

(ii) සහතිකයෙහි දක්වා ඇති තීරණය, ඒ තීරණයෙහි සඳහන් කර ඇති කරුණු මත විනිශ්චයාධිකාරය විසින් කරන ලද බවට සාක්ෂ්‍යය විය යුතු ය.

(ඇ) විනිශ්චයාධිකාරයට එරෙහිව අපහාස වන පරිදි හැතහොත් ඊට අගෞරව වන පරිදි කරන ලදැයි කියනු ලබන යම් වරදකට දඬුවම් කිරීම සඳහා මේ වගන්තියෙහි විධිවිධාන සලසා ඇති පරිදි ගනු ලබන යම් නඩු කටයුත්තක දී, විනිශ්චයාධිකාරයේ කිසිම සාමාජිකයකු, ඔහුගේම කැමැත්ත ඇතිව හැර, සාක්ෂිකරුවකු ලෙස කැඳවීම හෝ විභාග කිරීම හෝ නොකළ යුතු අතර, එවැනි කටයුත්තක් (අ) ඡේදයෙහි සඳහන් සහතිකය ලැබී මාස තුනක් ඇතුළත විභාග කොට ඒ සම්බන්ධයෙන් සුදුස්සක් කරනු ලැබිය යුතු ය.

28. අධිකරණයක් ඉදිරියෙහි සාක්ෂි දෙන සාක්ෂිකරුවකුට, ඒ අධිකරණය ඉදිරියෙහි ඔහු විසින් දෙනු ලබන සාක්ෂි සම්බන්ධයෙන් ඔහු හිමිකම් ලබන සියලු වරප්‍රසාද, විනිශ්චයාධිකාරය ඉදිරියෙහි සාක්ෂි දෙන සෑම සාක්ෂිකරුවකුට ම ඒ සාක්ෂි සම්බන්ධයෙන් හිමි විය යුතු ය. සාක්ෂිකරුවන් සතු වරප්‍රසාද.

29. මූල මණ්ඩලයෙහි, විනිශ්චයාධිකාරයක සෑම සාමාජිකයකු ම සහ රෙජිස්ට්‍රාර්වරයා හෝ එවැනි විනිශ්චයාධිකාරයක හෝ රෙජිස්ට්‍රාර්වරයාගේ යම් කාර්ය මණ්ඩලයක් හෝ විසින් ස්වකීය කාර්ය භාර ගැනීමට පෙර, ස්වකීය කාර්ය සම්බන්ධයෙන් තමා දැඩි රහස්‍යතාව පිළිපදින බවට පොරොන්දු වෙමින් ප්‍රකාශයක් අත්සන් කළ යුතු අතර, යම් කාරණයක්— රහස්‍යතාව.

(අ) විනිශ්චයාධිකාරය විසින් හෝ අධිකරණයක් විසින් හෝ ගනුදෙනුව හෝ කාරණය අදාළ වන තැනැත්තා විසින් හෝ හෙළිදරව් කරන ලෙස නියම කරනු ලැබූ විට හැර;

(ආ) ස්වකීය කාර්ය ඉටු කිරීමෙහිලා හැර; සහ

(ඇ) මේ පනතෙහි හෝ වෙනත් යම් ලිඛිත නීතියක හෝ විධිවිධාන කිසිවක් අනුව ක්‍රියා කිරීම පිණිස හැර

හෙළිදරව් නොකරන බවට ඒ ප්‍රකාශය මගින් පොරොන්දු විය යුතු ය.

**සිවිල් හෝ අපරාධ නඩු පවරනු ලැබීමෙන් ආරක්ෂාව.**

30. (1) රෙජිස්ට්‍රාර්වරයා විසින්, විනිශ්චයාධිකාරයෙහි සාමාජිකයකු විසින් හෝ එහි යම් නිලධරයකු නැතහොත් සේවා නියුක්තයකු විසින් හෝ මේ පනත යටතේ සද්භාවයෙන් කරන ලද හෝ කරන ලදැයි කියනු ලබන යම් ක්‍රියාවක් සම්බන්ධයෙන් රෙජිස්ට්‍රාර්වරයාට, ඒ සාමාජිකයාට, නිලධරයාට හෝ සේවා නියුක්තයාට විරුද්ධව කිසිදු සිවිල් හෝ අපරාධ නඩුවක් පවරනු නොලැබිය යුතු ය.

(2) (1) වන උපවගන්තියේ සඳහන් යම් තැනැත්තකු විසින්, මේ පනත යටතේ කරන ලද යම් වාර්තාවක් සම්බන්ධයෙන් ඒ තැනැත්තාට විරුද්ධව කිසිදු නඩුවක්, අපරාධ නඩුවක් හෝ සිවිල් හෝ අපරාධ වෙනත් නඩු කටයුත්තක් හෝ යම් අධිකරණයක හෝ විනිශ්චයාධිකාරයක පවරනු නොලැබිය යුතු ය.

**මේ පනත යටතේ වැරදි සිදු කරන තැනැත්තන් මහාධිකරණයේ විනිශ්චයකාරවරයකු ඉදිරියෙහි නඩු විභාග කරනු ලැබීමට භාජනය විය යුතු බව.**

31. වෙනත් යම් නීතියක විධිවිධානවල පටහැනිව කුමක් සඳහන්ව ඇත ද, මේ පනත යටතේ වූ යම් වරදක් සිදු කර ඇති යම් තැනැත්තකු මූලික විභාගයක් නොමැතිව, මහාධිකරණයෙහි එකලාව විනිශ්චයාරූඪව සිටින විනිශ්චයකාරවරයකු ඉදිරියෙහි අධි චෝදනා පත්‍රයක් මත, ජූරි සභාවක් නොමැතිව නඩු විභාග කරනු ලැබීමට භාජනය විය යුතු අතර, ඒ අධිකරණයෙ වෙනත් යම් කාර්යයකට කලින් එවැනි යම් නඩු විභාගයකට ඒ අධිකරණය විසින් ප්‍රමුඛත්වය දිය යුතු ය.

**නීතිපතිවරයා විසින් නඩු පැවරීම කරනු ලැබිය යුතු බව.**

32. නීතිපතිවරයා විසින් හැර, මේ පනත යටතේ වූ වරදක් සම්බන්ධයෙන් කිසිදු නඩු පැවරීමක් කරනු නොලැබිය යුතු ය.

**ලේඛන භාර දීම.**

33. මේ පනතේ හෝ ඒ යටතේ සාදන ලද යම් නියෝගයක හෝ කාර්ය සඳහා ලියාපදිංචි කළ තැපෑල යටතේ තැපැල් මගින් යවනු ලද යම් දැන්වීමක් හෝ වෙනත් දැනුම් දීමක්, එය තැපැල් කළ දින සිට දින තුනක් ඇතුළත දී ලිපි ගිම් වෙත ලැබී ඇති ලෙස, පටහැනිව කරුණු ඔප්පු කරනු ලබන තෙක්, සලකනු ලැබිය යුතු අතර, එසේ තැපැල් කරන ලද බවට රෙජිස්ට්‍රාර්වරයා විසින් අත්සන් තබන ලද සහතිකයක් ඒ පිළිබඳව මූල් බැල්මට පෙනෙන සාක්ෂි විය යුතු ය.

**පුද්ගල මණ්ඩල යනාදිය විසින් කරනු ලබන වැරදි.**

34. මේ පනත යටතේ වූ වරදක්—

(අ) පුද්ගල මණ්ඩලයක් විසින් සිදුකර ඇති අවස්ථාවක—

(i) ඒ මණ්ඩලය සංස්ථාගත කරනු ලැබූ මණ්ඩලයක් නම්, ඒ වරද සිදු කරන ලද අවස්ථාවේ දී ඒ මණ්ඩලයේ අධ්‍යක්ෂවරයකුව, ලේකම්වරයකුව නැතහොත් වෙනත් සමාන නිලධරයකුව සිටි සෑම තැනැත්තකුම ; හෝ

(ii) ඒ මණ්ඩලය සංස්ථාගත කරනු නොලැබූ මණ්ඩලයක් නම්, ඒ වරද සිදු කරන ලද අවස්ථාවේ දී ඒ මණ්ඩලයේ සාමාජිකයකුව හෝ හවුල්කරුවකුව නැතහොත් එහි ප්‍රධාන විධායක නිලධරයාව සිටි සෑම තැනැත්තකුම ; නැතහොත්

(ආ) මේ පනත යටතේ ලියාපදිංචි කරනු ලැබූ තැනැත්තකු සඳහා හෝ වෙනුවෙන සිදු කරන ලද අවස්ථාවක, ඒ ලියාපදිංචි කරනු ලැබූ තැනැත්තා

ඒ වරද තමාගේ අනුමතය හෝ අනුදැනුම හෝ නොමැතිව සිදු කරන ලද බවත් ස්වකීය කර්තව්‍යවල ස්වභාවය හා සියලු අවස්ථානුගත කරුණු ගැන සලකන කල්හි ඒ වරද සිදු කිරීම වැලැක්වීම පිණිස තමා විසින් දක්වනු ලැබිය යුතු නිසි සියලු උද්‍යෝගය තමා විසින් දක්වන ලද බවත් ඔප්පු කරනු ලැබුවහොත් මිස, ඔහු ඒ වරද සිදු කිරීම සම්බන්ධයෙන් වගකිව යුතු ය.

35. (1) යම් පොදු කොන්ත්‍රාත් ගිවිසුමකට අදාළ සාකච්ඡා කොන්ත්‍රාත් ගිවිසුමක් ලියා අත්සන් කිරීම මගින් අවසානයකට එළඹ නොමැති අවස්ථාවක හෝ යම් පොදු කොන්ත්‍රාත් ගිවිසුමකට එළඹෙනු ලැබ එම ගිවිසුම ඉටු කිරීම අවසන් කර නොමැති අවස්ථාවක නැතහොත් යම් පොදු කොන්ත්‍රාත් ගිවිසුමක් ඉටු කිරීම වෙනුවෙන් වූ අවසාන ගෙවීම මේ පනත ක්‍රියාත්මක වන දිනට ගෙවා නොමැති අවස්ථාවක, ඒ කොන්ත්‍රාත් ගිවිසුම සම්බන්ධයෙන් මේ පනතෙහි විධිවිධාන අවශ්‍ය වෙනස් කිරීම් සහිතව අදාළ විය යුතු ය. අවසානයකට එළඹ නොමැති පොදු කොන්ත්‍රාත් ගිවිසුම් ආදියට පනත අදාළ විය යුතු බව.

(2) පොදු කොන්ත්‍රාත් ගිවිසුමක සියලු බැඳීම් ඉටු කිරීම වෙනුවෙන් වූ අවසාන ගෙවීම මේ පනත ක්‍රියාත්මක වූ දිනට පසුව ගෙවා ඇත්තා වූ ද, ඒ කොන්ත්‍රාත් ගිවිසුම ප්‍රදානය කිරීමේ දී යම් පොදු මණ්ඩලයක් විසින් අනුගමනය කරන ලද කාර්ය පටිපාටියෙහි අක්‍රමිකතා තිබුණ බව නැතහොත් ඒ කොන්ත්‍රාත් ගිවිසුමෙහි සඳහන් නියම හා කොන්දේසි කඩ කිරීමක් සිදුව ඇති බව විමර්ශනයකින් පසුව, විනිශ්චයාධිකාරයෙහි මතය වන්නා වූ අවස්ථාවක, විනිශ්චයාධිකාරය අවශ්‍ය යයි සලකන යම් පරීක්ෂණ විනිශ්චයාධිකාරය විසින් කරනු ලැබිය හැකි අතර, ඒ පරීක්ෂණයේ ප්‍රතිඵල ජනාධිපතිවරයා වෙත සහ නීතිපතිවරයා වෙත වාර්තා කරනු ලැබිය හැකි ය. තව ද එවැනි යම් වාර්තාවක් සම්බන්ධයෙන් 22 වන වගන්තියෙහි විධිවිධාන අවශ්‍ය වෙනස් කිරීම් සහිතව අදාළ විය යුතු ය.

36. (1) මේ පනත යටතේ නියෝග සෑදීමට බලය දී ඇත්තේ යම් කාරණා සම්බන්ධයෙන් ද ඒ සියලු කාරණා සම්බන්ධයෙන් ජනාධිපතිවරයා විසින් හෝ ඒ විෂයය හෝ කටයුත්ත අමාත්‍යවරයකු වෙත පවරා ඇති අවස්ථාවක, ජනාධිපතිවරයාගේ එකඟත්වය ඇතිව ඒ අමාත්‍යවරයා විසින් හෝ නියෝග සාදනු ලැබිය හැකි ය. නියෝග.

(2) විෂයය හෝ කටයුත්ත අමාත්‍යවරයකු වෙත පවරා ඇති අවස්ථාවක, (1) වන උපවගන්තියෙන් පැවරී ඇති බලතලවල ව්‍යාප්තියට හානියක් නොමැතිව පහත දැක්වෙන කාරණා සියල්ල ම හෝ ඉන් යම් කාරණයක් හෝ සම්බන්ධයෙන් ජනාධිපතිවරයාගේ එකඟත්වය ඇතිව, ඒ අමාත්‍යවරයා විසින් නියෝග සාදනු ලැබිය හැකි ය :—

(අ) ලියාපදිංචි කිරීමේ ආකෘතිය හා ආකාරය සහ ඒ ලියාපදිංචි කිරීම වෙනුවෙන් ගෙවිය යුතු ගාස්තු;

(ආ) ලියාපදිංචිය අලුත් කිරීමේ හෝ නැවත ලියාපදිංචි කිරීමේ ආකෘතිය හා ආකාරය සහ ඒ අලුත් කිරීම හෝ නැවත ලියාපදිංචි කිරීම හෝ සඳහා ගෙවිය යුතු ගාස්තු ;

(ඇ) සහතික නිකුත් කරනු ලබන්නේ යම් කොන්දේසිවලට ඇතුළත් කළ යුතු කොන්දේසි ;

(ඈ) ලියාපදිංචි තැනැත්තන් විසින් තබා ගනු ලබන පොත්පත්, ලේඛන හෝ ගිණුම් පරීක්ෂා කිරීම ; සහ

(ඉ) සහතික ප්‍රදානය කරනු ලැබ ඇත්තේ යම් තැනැත්තන් වෙත ද ඒ තැනැත්තන් විසින් සපයනු ලැබිය යුතු වාර්තා හෝ වෙනත් තොරතුරු.

(3) මේ පනත යටතේ අමාත්‍යවරයා විසින් සාදනු ලබන සෑම නියෝගයක් ම ගැසට් පත්‍රයෙහි පළ කරනු ලැබිය යුතු අතර එසේ පළ කරන ලද දිනයෙහි හෝ නියෝගයෙහි සඳහන් යම් පසු දිනයක හෝ එය ක්‍රියාත්මක විය යුතු ය.

(4) අමාත්‍යවරයා විසින් සාදන ලද සෑම නියෝගයක් ම, එය පළ කරනු ලැබීමෙන් පසු හැකි පහසු ඉක්මණින් අනුමතය සඳහා පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය. එසේ අනුමත කරනු නොලැබූ යම් නියෝගයක්, එය යටතේ කලින් කරන ලද කිසිවකට හානියක් නොමැතිව, එහි අනනුමතයේ දින සිට පරිච්ඡින්න කරනු ලැබූ ලෙස සලකනු ලැබිය යුතු ය.

(5) යම් නියෝගයක් එසේ පරිච්ඡින්න කරනු ලැබූ ලෙස සලකනු ලැබිය යුතු දිනය පිළිබඳ නිවේදනයක්, ගැසට් පත්‍රයෙහි පළ කරනු ලැබිය යුතු ය.

විනිශ්චයාධිකාරයේ නිලධරයන් සහ සේවකයන් ද රෙජිස්ට්‍රාර්වරයා ද රජයේ නිලධරයන් ලෙස සලකනු ලැබිය යුතු බව.

37. විනිශ්චයාධිකාරයේ සියලු නිලධරයන් සහ සේවකයන් ද, රෙජිස්ට්‍රාර්වරයා ද දණ්ඩ නීති සංග්‍රහයේ අර්ථානුකූලව සහ එහි කාර්ය සඳහා රජයේ නිලධරයන් ලෙස සලකනු ලැබිය යුතු ය.

විනිශ්චයාධිකාරය විසින් ජනාධිපතිවරයා වෙත වාර්තා සැපයිය යුතු බව.

38. (1) සම්පූර්ණ කරන ලද වර්ෂය තුළ විනිශ්චයාධිකාරයේ වැඩ පිළිබඳව වාර්තාවක්, විනිශ්චයාධිකාරය විසින් නිශ්චය කරනු ලබන යම් ආකෘතියක සහ එසේ අනුමත කරනු ලබන විස්තර සහිතව විනිශ්චයාධිකාරයේ සභාපතිවරයා විසින් ජනාධිපතිවරයා වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

(2) (1) වන උපවගන්තිය යටතේ ඉදිරිපත් කරනු ලබන වාර්තා වලට අමතරව, අවශ්‍ය යයි විනිශ්චයාධිකාරය සලකන යම් කාරණා පිළිබඳව වෙනත් වාර්තා විනිශ්චයාධිකාරය විසින් ජනාධිපතිවරයා වෙත ඉදිරිපත් කරනු ලැබිය හැකි අතර, විනිශ්චයාධිකාරයේ ක්‍රියා කාරකම් සහ කටයුතු සම්බන්ධයෙන් ජනාධිපතිවරයා විසින් කලින් කල ඉල්ලා සිටිනු ලබන යම් තොරතුරු ජනාධිපතිවරයා වෙත සැපයීම ද විනිශ්චයාධිකාරය විසින් කරනු ලැබිය යුතු ය.

39. විනිශ්චයාධිකාරයේ කිසිම ක්‍රියාවක් හෝ නිරණයක් රිට් ආඥාවක් මගින් හෝ අන්‍යාකාරයකින් හෝ යම් අධිකරණයක දී ප්‍රශ්න කරනු නොලැබිය යුතු ය.

විනිශ්චයාධිකාරයේ ක්‍රියා සහ තීරණ.

40. ජනාධිපතිවරයා විසින් අන්‍යාකාරයකින් විධාන කරනහොත් මිස, විනිශ්චයාධිකාරය ඉදිරියෙහි වූ සියලු නඩු කටයුතු රහසිගතව කරනු ලැබිය යුතු ය.

විනිශ්චයාධිකාරයේ නඩු කටයුතු.

41. මේ පනත යටතේ ලියාපදිංචි කරනු ලැබූ යම් තැනැත්තකු විසින් මේ පනත යටතේ කරනු ලැබීමට හෝ ඉටු කරනු ලැබීමට නියමිත යම් කාරණයක් සම්බන්ධයෙන් ලියවිල්ලකින් වූ සාමාන්‍ය හෝ විශේෂ විධාන, ජනාධිපතිවරයාගේ පූර්ව ලිඛිත අනුමතය ඇතිව, රෙජිස්ට්‍රාර්වරයා විසින් කලින් කල ඒ තැනැත්තා වෙත දෙනු ලැබිය හැකි ය.

සාමාන්‍ය හෝ විශේෂ විධාන කිරීමට රෙජිස්ට්‍රාර්වරයාට ඇති බලය.

42. ස්වකීය ධුරයෙහි කටයුතු භාර ගනු ලබන විට විනිශ්චයාධිකාරයේ සභාපතිවරයා විසින් ජනාධිපතිවරයා ඉදිරියෙහි දිවුරුම් දීම හෝ ප්‍රතිඥා දීම කළ යුතු අතර, විනිශ්චයාධිකාරයේ අනෙක් සාමාජිකයන් සහ රෙජිස්ට්‍රාර්වරයා විසින් ඒ දිවුරුම් දීම හෝ ප්‍රතිඥා දීම ජනාධිපතිවරයාගේ ලේකම්වරයා ඉදිරියෙහි කළ යුතු ය. රෙජිස්ට්‍රාර්වරයාගේ නිලධරයන් සහ කාර්ය මණ්ඩලය විසින් ඒ දිවුරුම් දීම හෝ ප්‍රතිඥා දීම රෙජිස්ට්‍රාර්වරයා ඉදිරියෙහි කළ යුතු ය.

දිවුරුම දීම හෝ ප්‍රතිඥා දීම.

43. මේ පනතේ විධිවිධාන කිසිවක් හෝ ඒ යටතේ සාදන ලද නියෝග කිසිවක් හෝ කඩ කරන සෑම තැනැත්තකු ම මේ පනත යටතේ වරදකට වරදකරු විය යුතු ය.

විධිවිධාන කඩ කිරීම වරදක් බව.

44. දණ්ඩනයක් නියම කර නොමැති මේ පනත යටතේ වූ වරදක් සඳහා වරදකරු වන සෑම තැනැත්තකු ම, රුපියල් එක් ලක්ෂයක් නොඉක්මවන දඩයකට හෝ අවුරුදු දෙකක් නොඉක්මවන කාලයක් සඳහා බන්ධනාගාරගත කිරීමකට හෝ ඒ දඩය හා බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකට ම හෝ යටත් විය යුතු ය.

දණ්ඩනයක් නියම කර නොමැති වැරදි සඳහා දණ්ඩනය.

45. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස, මේ පනතෙහි—

අර්ථ නිරූපණය.

"ප්‍රධාන විධායක නිලධරයා" යන්නෙන්—

(අ) ආණ්ඩුවේ දෙපාර්තමේන්තුවක් සම්බන්ධයෙන් වන විට, ඒ දෙපාර්තමේන්තුවෙහි ප්‍රධානයා ;

(ආ) රාජ්‍ය සංස්ථාවක් සම්බන්ධයෙන් වන විට, එහි සභාපතිවරයා ; හෝ

(ඇ) පළාත් පාලන ආයතනයක් සම්බන්ධයෙන් වන විට, අවස්ථාවෝචිත පරිදි, නගරාධිපතිවරයා හෝ සභාපතිවරයා

අදහස් වේ ;

"කොන්ත්‍රාත් ගිවිසුම" යන්නෙන්, යම් පොදු මණ්ඩලයක් විසින් හෝ පොදු මණ්ඩලයක් වෙනුවෙන් කැඳවන ලද ටෙන්ඩර් ප්‍රකාර ඇතුළත් වීමට අදහස් කර ඇති හෝ ඇතුළත් වන හෝ ඇතුළත්ව ඇති යම් කොන්ත්‍රාත් ගිවිසුමක්, ගිවිසුමක්, පොරොන්දුවක් නැතහොත් ටෙන්ඩර් කිරීම සඳහා වූ කැඳවීමක් අදහස් වේ ;

"කොන්ත්‍රාත් ගිවිසුම පවත්නා කාලය" යන්න, එහි ව්‍යාකරණානුකූල ප්‍රභේද හා සජාතීය යෙදුම් සමග ගත් විට, යම් පොදු කොන්ත්‍රාත් ගිවිසුමක් සම්බන්ධයෙන් පිරිවිතර පිළියෙල කිරීම ආරම්භයේ සිට සියලු කොන්ත්‍රාත් ගිවිසුම් පාර්ශ්වකරුවන්ගේ සියලු බැඳීම් සම්පූර්ණ කර නිදහස් කිරීම තෙක් වූ කාලය ඉන් අදහස් වේ ;

"පළාත් පාලන ආයතනය" යන්නෙන් යම් මහ නගර සභාවක්, හෝ නගර සභාවක්, අදහස් වන අතර, ඒ යම් සභාවක් විසින් ක්‍රියාත්මක කරන හා ඉටු කරන බලතලවලට, කාර්යවලට සහ කර්තව්‍යවලට අනුරූප වන්නා වූ හෝ සමාන වන්නා වූ බලතල, කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම සහ ඉටු කිරීම සඳහා යම්කිසි නීතියකින් හෝ නීතියක් යටතේ ඇතිකොට පිහිටුවන ලද කවර වූ හෝ අධිකාරයක් ද ඊට ඇතුළත් වේ ;

"සාම නිලධරයෝ" යන්නට පොලිස් නිලධරයන් ද පොලිස් කාර්ය ඉටු කිරීම සඳහා දිසාපතිවරයකු විසින් ලියවිල්ලකින් පත් කරන ලද ග්‍රාම සේවා නිලධාරීන් ද ඇතුළත් වෙති ;

"නියමිත" යන්නෙන් මේ පනත මගින් හෝ මේ පනත යටතේ සාදන ලද නියෝග මගින් හෝ නියමිත බව අදහස් වේ ;

"පොදු මණ්ඩලය" යන්නෙන් ආණ්ඩුවේ, රාජ්‍ය සංස්ථාවක හෝ පළාත් පාලන ආයතනයක යම් දෙපාර්තමේන්තුවක්, කාර්යාලයක් හෝ ආයතනයක් අදහස් වන අතර යම් ලිඛිත නීතියක් යටතේ ආණ්ඩුව වෙත සතු වී ඇති යම් ව්‍යවසායක් ද ඊට ඇතුළත් වේ ;

"පොදු කොන්ත්‍රාත් ගිවිසුම" යන්නෙන්, යම් පොදු මණ්ඩලයක් විසින් හෝ පොදු මණ්ඩලයක් වෙනුවෙන් වූ ටෙන්ඩර් ප්‍රකාර ඇතුළත් වීමට අදහස් කර ඇති හෝ ඇතුළත් වන හෝ ඇතුළත්ව ඇති, යම් පොදු මණ්ඩල

යකට යම් වැඩක් හෝ සේවයක් ඉටු කිරීම සඳහා වූ හෝ යම් බඩු ද්‍රව්‍ය හෝ දේපළ සැපයීම සඳහා වූ යම් කොන්ත්‍රාත් ගිවිසුමක් අදහස් වන අතර, පොදු මණ්ඩලයක සන්තකයෙහි හෝ එහි බලය හෝ පාලනය යටතේ ඇති බඩු, ද්‍රව්‍ය හෝ දේපළ කිසිවක් ඒ පොදු මණ්ඩලය විසින් විකිණීම නැතහොත් බැහැර කිරීම සඳහා වූ යම් කොන්ත්‍රාත් ගිවිසුමක් ද ඊට ඇතුළත් වේ;

"රාජ්‍ය සංස්ථාව" යන්නෙන් 1982 අංක 17 දරන සමාගම් පනත යටතේ හැර, වෙනත් යම්කිසි ලිඛිත නීතියකින් හෝ ලිඛිත නීතියක් යටතේ හෝ පිහිටුවන ලද්දා වූ හෝ පිහිටුවනු ලබන්නා වූ ද, ආණ්ඩුව විසින් ප්‍රදානයක් හෝ ණයක් වශයෙන් නැතහොත් වෙනත් ආකාරයකින් මුළු අරමුදල හෝ මුළු ප්‍රාග්ධනය නැතහොත් අරමුදලෙන් කොටසක් හෝ ප්‍රාග්ධනයෙන් කොටසක් හෝ සපයනු ලබන්නා වූ ද සංස්ථාවක්, මණ්ඩලයක් හෝ වෙනත් ආයතනයක් අදහස් වේ;

"රෙජිස්ට්‍රාර්වරයා" යන්නට, සහකාර රෙජිස්ට්‍රාර්වරයකු ද ඇතුළත් වේ;

"සීමාකාරී පිරිවිතර" යන්නෙන්, පොදු කොන්ත්‍රාත් ගිවිසුමක් පිරිනැමීමේ දී විශේෂ ටෙන්ඩර්කරුවකුට වාසි සැලසෙන පරිදි ටෙන්ඩරයේ විෂය කාරණාවට අදාළව වුවමනාවෙන් ම සාදන ලද යම් පිරිවිතරක් අදහස් වේ;

"රාජ්‍ය නිලධරයා" යන්නෙන්, අධිකරණ නිලධරයකු හැර ශ්‍රී ලංකා ජනරජය යටතේ වැටුප් ලබන ධුරයක් දරන තැනැත්තෙක් අදහස් වේ;

එහෙත් ඊට—

(අ) ජනාධිපතිවරයා ;

(ආ) කථානායකවරයා ;

(ඇ) අධිකරණ සේවා කොමිෂන් සභාවේ සාමාජිකයෙක් ;

(ඈ) රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සාමාජිකයෙක් ඇතුළත් නොවේ ;

"තාක්ෂණ කමිටුව" යන්නෙන්, යම් පොදු කොන්ත්‍රාත් ගිවිසුමකට අදාළව පිරිවිතර පිළියෙල කිරීමේ වගකීම භාර කර ඇති යම් තැනැත්තෙක් හෝ පුද්ගල මණ්ඩලයක් හෝ අදහස් වේ;

"ටෙන්ඩර්කරු" යන්නෙන්, යම් පොදු මණ්ඩලයක් සමග යම් පොදු කොන්ත්‍රාත් ගිවිසුමකට ඇතුළත් වන්නා වූ හෝ පොදු මණ්ඩලයක් සමග ඇති එවැනි යම් කොන්ත්‍රාත් ගිවිසුමක් සම්බන්ධයෙන් අපේක්ෂිත ටෙන්ඩර්කරුවකු, කොන්ත්‍රාත්කරුවකු හෝ සැපයීම්කරුවකු වන්නා වූ—

(අ) එක් තැනැත්තකු හෝ වැඩි ගණනක් ශ්‍රී ලංකාවේ පුරවැසියන් නොවන හෝ ශ්‍රී ලංකාවේ සාමාන්‍යයෙන් වාසය නොකරන තැනැත්තන්ගෙන් සමන්විත කිසියම් සහවාසයක් : හෝ

(ආ) ශ්‍රී ලංකාවෙන් පිටත සංස්ථාගත කර ඇත්තා වූ හෝ ලියාපදිංචි කර ඇත්තා වූ හෝ ස්වකීය ප්‍රධාන ව්‍යාපාරික ස්ථානය පිහිටා ඇත්තා වූ හෝ සමාගමක් හෝ ව්‍යාපාරික ආයතනයක් ; හෝ

(ඇ) ශ්‍රී ලංකාවෙහි සාමාන්‍යයෙන් වාසය කරන්නා වූ හෝ එසේ වාසය නොකරන්නේ නම්, ශ්‍රී ලංකාවෙහි පුරවැසියකුව සිටියා වූ යම් පුද්ගලයෙක් ; හෝ

(ඈ) ශ්‍රී ලංකාවෙහි සංස්ථාගත කරනු ලැබ ඇත්තා වූ හෝ ප්‍රධාන ව්‍යාපාරික ස්ථානය ශ්‍රී ලංකාව තුළ පිහිටුවා ඇත්තා වූ යම් සමාගමක්, ව්‍යාපාරික් ආයතනයක් හෝ පොදු මණ්ඩලයක් ;

(ඉ) යම් සමාගමක් හෝ ව්‍යාපාරික ආයතනයක් ශ්‍රී ලංකාවෙහි සංස්ථාගත කර හෝ එහි ප්‍රධාන ව්‍යාපාරික ස්ථානය ශ්‍රී ලංකාව තුළ පිහිටා හෝ නොමැත්තා වූ ද එහි යම් අධ්‍යක්ෂවරයකු, ගෙවුල් [illegible] ඒකී [illegible] සියයට විසි [illegible] ප්‍රමාණයක් දරන ලබන හෝ ශ්‍රී ලංකාවේ පුරවැසියකුව සිටියා වූ යම් සමාගමක් හෝ ව්‍යාපාරික ආයතනයක්

අදහස් වේ ;

“ටෙන්ඩරය” යන්නට යම් ලංසුවක්, අර්පණයක්, මිල ගණන් දැක්වීමක් හෝ යෝජනාවක් ඇතුළත් වේ.

**පළමුවන උපලේඛනය**

**මූල මණ්ඩලයේ සාමාජිකයන්ට අදාළ විධිවිධාන**

1. යම් තැනැත්තකු පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු නම්, ඔහු මූල මණ්ඩලයේ සාමාජිකයකු ලෙස පත් කරනු ලැබීමට හෝ සාමාජිකයකු ලෙස සිටීමට හෝ නුසුදුස්සකු විය යුතු ය.

2. මූල මණ්ඩලයේ සාමාජිකයකු ලෙස යම් තැනැත්තකු පත් කිරීමට පෙර, මූල මණ්ඩලයේ සාමාජිකයකු ලෙස ස්වකීය කර්තව්‍ය ඉටු කිරීම කෙරෙහි හානිකර ලෙස බලපෑමට ඉඩ ඇති මුදල් පිළිබඳ හෝ වෙනත් සම්බන්ධතා හෝ ඒ තැනැත්තාට නොමැති බවට ජනාධිපතිවරයා, තමා ම සෑහීමට පත් විය යුතු ය. ජනාධිපතිවරයා විසින් පත් කරන ලද යම් තැනැත්තකු විසින්, මේ පනත යටතේ වූ ස්වකීය කාර්ය ඉටු කිරීම සඳහා අවශ්‍ය යයි ජනාධිපතිවරයා සලකන යම් තොරතුරු තමා වෙත සපයන ලෙස ජනාධිපතිවරයා ඉල්ලා සිටින කවර හෝ විටක ඒ තොරතුරු ජනාධිපතිවරයා වෙත සපයනු ලැබිය යුතු ය.

3. ඇති කර ගනු ලැබූ හෝ ඇති කිරීමට අදහස් කරනු ලබන හෝ පොදු කොන්ත්‍රාත් ගිවිසුමකට කෙළින් ම හෝ අන් අයුරකින් යම් ආකාරයක සම්බන්ධතාවක් දක්වන මූල මණ්ඩලයේ සාමාජිකයකු විසින්, තම සම්බන්ධතාවේ ස්වභාවය ජනාධිපතිවරයා වෙත හෙළිදරව් කළ යුතු ය.

4. මූල මණ්ඩලයේ සෑම සාමාජිකයකු ම—

(අ) 6 වන ඡේදයෙහි විධිවිධානවලට යටත් ව, ඒ සාමාජිකයා පත් කරනු ලැබූ සාධන පත්‍රයෙහි ජනාධිපතිවරයා විසින් සඳහන් කළ යුතු පරිදි අවුරුදු තුනක් නොඉක්මවන කාලයක් සඳහා ධුරය දැරිය යුතු ය; තවද

(ආ) නැවත පත් කරනු ලැබීමට සුදුස්සකු විය යුතු ය.

5. ජනාධිපතිවරයා විසින්, මූල මණ්ඩලයේ යම් සාමාජිකයකු කිසිදු හේතුවක් නොදක්වා ධුරයෙන් ඉවත් කරනු ලැබිය හැකි ය.

6. රජයේ නිලධරයකු නොවන මූල මණ්ඩලයේ සාමාජිකයකුට, තමා ඉල්ලා අස්වන බවට ජනාධිපතිවරයා අමතා යවනු ලබන ලිපියක් මගින්, ඔහු සාමාජිකයකුව සිටින මූල මණ්ඩලයෙන් ඉල්ලා අස් විය හැකි ය.

7. මූල මණ්ඩලයේ සාමාජිකයකුගේ ධුරය හිස් වන හෝ අසනීප වීමේ නැතහොත් වෙනත් අබලතාවක හේතුවෙන් හෝ ශ්‍රී ලංකාවෙන් බැහැරව සිටීමෙන් හෝ ඒ සාමාජිකයාට ස්වකීය ධුරයෙහි කාර්ය ඉටු කිරීමට තාවකාලිකව නොහැකි වන අවස්ථාවක, ඒ සාමාජිකයා වෙනුවට වෙනත් තැනැත්තකු, ජනාධිපතිවරයා විසින් පත් කරනු ලැබිය හැකි ය.

8. මූල මණ්ඩලයේ සාමාජිකයන්ට ජනාධිපතිවරයා විසින් තීරණය කරනු ලබන ආකාරයක සහ ප්‍රමාණයක පාරිශ්‍රමික ගෙවනු ලැබිය යුතු අතර, ඔවුන් ජනාධිපතිවරයා විසින් තීරණය කරනු ලබන සේවා කොන්දේසිවලට යටත් විය යුතු ය.

## දෙවන උපලේඛනය

රෙජිස්ට්‍රාර්වරයා විසින් මේ පනතේ 6 වන වගන්තිය යටතේ පවත්වා ගෙන යනු ලබන ලේඛනයෙහි ඇතුළත් කිරීමට නියමිත විස්තර, පහත දැක්වෙන විස්තර විය යුතු ය:—

(අ) පොදු සමාගමක් සම්බන්ධයෙන් වන විට, එක් එක් අධ්‍යක්ෂවරයාගේ නම, ලිපිනය සහ ජාතිය ;

(ආ) පෞද්ගලික සමාගමක් සම්බන්ධයෙන් වන විට, එක් එක් අධ්‍යක්ෂවරයාගේ සහ එක් එක් කොටස්කරුගේ නම, ලිපිනය සහ ජාතිය ;

(ඇ) ව්‍යාපාරික ආයතනයක් සම්බන්ධයෙන් වන විට, එහි හවුල්කරුවන්ගේ නම්, ලිපින සහ ජාතිය සහ ඒ ව්‍යාපාරික ආයතනයේ එක් එක් හවුල්කරුට ඇති මූල්‍ය සම්බන්ධතාවේ ප්‍රතිශතය ;

(ඈ) පුද්ගලයකු සම්බන්ධයෙන් වන විට, ඒ පුද්ගලයාගේ නම, ලිපිනය සහ ජාතිය ;

(ඉ) ටෙන්ඩර්කරුවකු වෙනුවෙන් අනුයෝජිතයකු, උප අනුයෝජිතයකු, නියෝජිතයකු හෝ නාමිකයකු වශයෙන් ක්‍රියා කරන සෑම තැනැත්තකුගේ ම නම, ලිපිනය සහ ජාතිය ;

(ඊ) ටෙන්ඩරයක් ප්‍රදානය කරනු ලබන අවස්ථාවක—

(i) ටෙන්ඩරය ලබා ගත් ටෙන්ඩර්කරුගේ නම, ලිපිනය සහ ජාතිය ;

(ii) ඒ ටෙන්ඩරය පිරිනැමීම සඳහා භාර ගන්නා ලද මුදල ;

(iii) ටෙන්ඩරය ලබා ගත් ටෙන්ඩර්කරු වෙනුවෙන් අනුයෝජිතයකු, උප අනුයෝජිතයකු, නියෝජිතයකු හෝ නාමිකයකු වශයෙන් ක්‍රියා කරන සෑම තැනැත්තකුගේ ම නම, ලිපිනය සහ ජාතිය ;

(උ) මේ පනතේ විධිවිධානවලට අනුකූලව යථා පරිදි ක්‍රියා කරනු ලබන බවට සහතිකවීම පිණිස අවශ්‍ය විය හැකි වෙනත් යම් විස්තර.

පාර්ලිමේන්තුවේ පනත් කෙටුම්පත්වල සහ නීතිවල වාර්ෂික දායක මිල (දේශීය) රු. 150 යි. (විදේශීය) රු. 200 යි. කොළඹ 1, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.